

# මූලික සන්නය

# මූ ල සි ඛා

සන්නසහිතයි.

රාමඤ්ඤ නිකායික දසවග්ගී කාරකසභාවට
ඇතුලත්වූ මාතර
සිරි සද්ධම්මාචරිය ඤාණිස්සර තෙරුන්නාන්සේ
විසින් සන්නකර සකස් කරණලදී.

වැලිගම පලාතේ විවාහ රජිස්ත්‍රාර්
තිලක කරණ ආචාර්‍ය්‍ය
දොන් අන්ද්‍රිස් හුඩාවේ පණ්ඩිතගුණවර්‍ධන
මුහන්දිරම් මැතිතුමා විසින්
පි ළි ග න් නා ල දු ව.

ගාල්ලේ ඇස්. ඒ. ඉසෑඩ්. සිරිවර්‍ධන සහ
පොන්බල්පු කන්කානන්ගෙයි
කුරෙලිස්ද සිල්වාද විසින් ප්‍රසිද්ධකරණලදී.

GALLE:
Printed by S. A. Z. Siriwardene.
ශ්‍රී බුද්ධවර්‍ෂ 2431

1887.

# වි ඥා ප න ය.

## මුළුසිකා.

මෙනම්පොත පාරාජිකා නිදේශය, සඞ්ඝාදිසෙස නීර්දෙශය, නිස්සග්ගිය නිර්දෙශය, පාචිත්තිය නිර්දෙශය, පකිණ්ණක නිර්දෙශය, වත්තාදිකණ්ඩයයි පරිච්ඡෙදසයකින් උපලක්ෂිතයි.

පාරාජිකා නිර්දෙශයෙහි සතර පාරාජිකාවද, සඞ්ඝාදිසෙස නිර්දෙශයෙහි, කුටිකාර, විහාරකාර, සඞ්ඛ්‍යාත දෙසික්‍ෂාව මොවුන්ගේම නය අනුව ගියහෙයින්ද සඞ්ඝභෙදක, සඞ්ඝභෙදානුවත්තක, දුට්ඨ, කුලදූසක, සඞ්ඛ්‍යාත සික්ෂාපද චතුෂ්කය චිරකාලයකින් පැමිණිය යුතුහෙයින්ද, අත්හැරඅවශෙෂ සඞ්ඝාදිසෙසාපත්තිගතද. නිස්සග්ගිය නිර්දෙශයෙහි තිස්නිසග්ගිවලින් සංක්‍ෂෙපනයානුගත සික්‍ෂාපද සොළසක්හැර තුදුසක්ද, පාචිත්තිය නිර්දෙශයෙහි දෙඅනූ පචිතිඅතුරෙන් සංක්‍ෂෙපගතවූ සියුම්වූ එක්පනසක්හැර එක්සාළිසක්ද, පකිණ්ණක නිර්දෙශයෙහි තුලසිදුස්සකෘත දුණ්ණිසිතාදියද, වත්තාදිකණ්ඩයෙහි උපධ්‍යාය, වත්ආදිය සහ පොහො පවුරුණුක්‍රම විස්තරවශයෙන්ද දක්වා ග්‍රන්ථපරිසමාප්තිය කරණලදී-භික්‍ෂූන්ට වහාදැනගන්නට ඕනෑවූසික්‍ෂාපදසඞ්ග්‍රහකොට යොදනලද මෙම සුළු ප්‍රකරණය අභිනවූපසම්පන්න භික්‍ෂූන්ගේ ග්‍රහණධාරණාදියට ඉතාපහසුවා පමණක් නොව මාහැඟිදවෙයි. ග්‍රන්ථ කර්තෘවූ ආචාර්‍ය්‍යවරයා බොහෝ වාක්‍යවලින් කියයුතු සික්‍ෂාපද ඉතා සංක්‍ෂෙපනයින්කියා හඳුන්වාතිබෙන ආකාරයෙන්ම විනයෙහි ප්‍රවීණතර ශබ්දශාස්ත්‍රාදියෙහි අතිශය බුද්ධිමත් උගතෙක්බව ජේනනමුත් අසවල්නම් ආචාර්‍ය්‍යවරයයි යනබවක් කිසිපොතක පතක අපවිසින් නොදක්නාලදී-මෙම පොතට ටීකාදෙකක්ද පුරාණභාව සන්නයක්ද තිබේ. ටීකාදෙකේ අර්ථවර්ණනාව බොහෝ තැන්වලදී එකිනෙකට විසම්සි, සන්නය යොදාතිබෙන වචනවලින්ම ඉතාපුරාණවැඩක්බව හැඟෙයි, සන්නවාක්‍යද පෙලටවඩා දික්නෑත, දැනට තිබෙන එළුකාව්‍ය පොත්පත්හිද බෙහෙවින් නොපෙනෙන පුරාණ සිංහල වචනවලින් ගහණය. අව්‍යුත සියබස් නෙරුතතිකනයැති ආධුනිකයන්ට අතිසයින්ම දුර්බෝධය, එහෙයින්ම දැනට එම්සන්නයෙන් ප්‍රයොජන ගන්නෝ ඉතාවිරලයි-ඒසන්නයෙහි තත්‍වාවබොධය පිණිස වාක්‍යකීපයක් මෙහිදක්වමි.

තුන්ලොවට උතුම්රුවන්නියාකා විසිමුනි තුන්දෙරින් සක
සාවැද උපස පුවලද පැවිජ්ජාපටන් හික්මවියයුතු සරිත්වරින්
සිඛසැබෙවින් කියනෙමි. (ප්‍රථම පාරාජිකාවගැණ)-මිනිස් අමිනි
ස්තිරිසනුන්ගේ * මඟතියායෙහි සෙවියටි සිතින්තමා මඟමෙහෙ
හුවපරිජිණේ. මේහැම මෙවුන්ධම් පරිජිනම්-(ප්‍රථම සඞ්ඝාදිසෙ
සයගැණ) සුකුරු මිදියටි සිතින් සිනිනෙන්විනා අදඇති බැහැ
රීවත්හි තමාහදන් සටා සුකුරු මිඳුවසඟ වෙසෙස්වේ-මේහැම සු
ක්විසටිසඟ වෙසෙස්නම්-(පළමුවෙනි නිසගිය ගැණ)-නොඉටා
නොවිකපා අයල් සිවුරු දසදවසක් ඉකුම්වාතම් නිසගිවේ-
(මුල්පචිතියගැණ)-වසානිකට ටිවමුසවානිව මෙරමා දත පචිතිවේ-
(ප්‍රකිණිකමුල)-ඉසුරු පමුණුවා සඟසතු ගුරුබඩු අන්නට දේනම්
ථුල්ලැසිවේ- මේපුරාණ සන්නයේ තද්භව විසින් යෙදිතිබෙන
එලුවචන බෙහෙවින් මහපණකුරුවලින් මිශ්‍රවපෙණේ. දම්පි
යාජාතක ගැටපද සන්න පුරාණ සිලාලෙඛනාදියෙහිද එලෙස
මයි, ඒ එසේවිතිබෙන්නේ පළමු දඹදිව් වැස්සන් ලක්දිවට පැ
මිණි අභිනව කාලයේදී ඒ දඹදිවින් ආවුන්ට පුරුදු පාලිභාෂාදි
ය සහ එවකට ලක්දිව සිටිය සිංහල ජනයන්ට පුරුදුව තුබුන
සිංහල භාෂාව එකට ආකුලකරගණ උභය පක්ෂයේ ජනයන් අ
තරේ කථාව්‍යවහාරය පැවිතුන සෙයිනැයිනියා සිතියහැක්ක එ
පමණක්දනොව ඒ පුරුදු ව්‍යවහාරයවූ පරිද්දෙන්ම තත්කාල
යෙහි සාදනලද සන්න පොත් පත් ගල්සන්නස් වල මහපණ
කුරු මිශ්‍රවචන යොදනලදැයි කියාත් තවද පුරාණ සිංහලභෝ
ඩියේ, අ: ඉ: උ: එ: ඔ: යන ප්‍රාණාක්ෂර පසහා මූර්ධනැළකාරය
හැර මහපණකුරු සහිතව ගාත්‍රාක්ෂර තිස්දෙකක් පෙණෙනබැ
වින් පුරාණකාලයෙහි සිංහල භාෂාව මහපණකුරු මිශ්‍රකොටව්‍ය
වහාර කරණ ලදැයි කියාත්, පසුව කල්යාමෙන් උච්චාරණ සැප
යම ව්‍යවහාරභාෂා පෙරලියාමට හෙතුවන බැවින් උච්චාරණ
සැපයනිසා මහපණකුරු සිංහල භාෂාව්‍යවහාරයට නොගෙණ
අල්ප ප්‍රාණාක්ෂරපමණක්ම ව්‍යවහාරකරණලදැයිකියාත් සිදත්සඟ
රාවේඅක්ෂරනියමයෙන්දපසුකාලයේතබනලදගල්සන්නස්වලි
න්දසිංහලකාව්‍යවලින්දපැහැදිලිවසයෙන්සිතියහැකිවේ-දම්පියා
ගැටපදයෙහි-ලුජ්ජති පලුජ්ජතිසි, ගතසඛරලොව්, මේයතදගවි
ඛඹුන් සුමුසේ පහන්ගැණ කියත් මෙහෙ.

මෙසේ තුනුරුවනට නමකරකොට දැන්තමන් වියඛ්‍යන්ක
වැටිගත් දක්වති-මේදෙගසින් කුම්නියුහයත්, තුමන්වැණිය සු

---

* ඇතම් පොතක, 'තිරිසන් මාගම් පිරිමිනින්ගේ' යී තිබේ.

න්‍ධු ධම්කිහුහ ඒධමට නිදන්කිහුහ. ඒධමිහි පයොජන්කිහුහු, ය නාදියයි-ජාතක ගැටපදයෙහි-ධම්මකො නාමපබ්බතො, හැම බෝසතුන් තවුස් පැවිදිව ඒපව්ධම්මවටන බැවින් ධම්මකනම්වූ පබ්බතයෙක්විය, දියරුක්පලූ සපන්සමුදු වැලිතලෙන් ඔරජනා බිම්පියෙස්ඇති ඒ ධම්පව්වන සෙලෙහි, යනාදි කියනලදී-මාග ම කිරින්දේ සිලාලෙඛනය-සිඬම්, අපරිමිතෙ ලොකෙහි බුධසමෙ නාති, අඨානෙ පරිමණ්ඩලෙ සවනාපුතොපෙතෙ අනුතරෙ සෙඨම ගෙසරණෙලකිවකෙ බුධනිම් සයම්භූ-තිස්සමහා රාමයෙහි සිලා ලෙඛනය-බුදදසමගිද මහසෙන තවකබාය අභයමහරජ-පෙ- රජකොලිහිහණනමිනි, යනාදියයි-අනුරාධපුර පලාතේ ගල්නෑන් නසක්-සිරිසංග්බොයිමපුර්මුබා පසලොස්වන්නේනවයැ පුරදසව ක් දවස් පාණ්ඩිරද්දූ, යනාදියයි-

තවද අපවිසින් යොදනලද මෙම සන්නයෙහි විස්තරකළ යුතුතැන් පොරාණටීකා ආදියෙන් පාඨදක්වා භාවය සහිතව අඩොලිපිවලින් යොදාඇත. මෙමපොත ශුද්ධකිරීමගැණ ලොන්ඩන් නුවරද රැන්ගුම්හිද මුද්‍රාඞ්කිත කරණලද මූලසික පාඨද ලඞ්කාවේ මූලසිකපාඨ කීපයක්ද එකතුකොට යථාශක්තින්ශුද්ධකාර සලිත් ආධුනිකයන්ගේ සුඛාවබොධය පිණිස පදගුතාර්ථසන්නයක්ද යොදා මුද්‍රාඞ්කිත කරවනලදී-තවද මෙමපොතෙහි, 8 අදින්නං මානුසං හණ්ඩං, යනාදි ගාථාවලහට පස්විසි අවහාරයගැණ.

1 ආදියනෙතා හරනෙතාච හරනෙතාඉරියාපථං
විකොපෙනෙතා තථොඨානාචාවෙනෙතාපි පරාජිකො

2 නානෙක භණ්ඩානං පඤ්චකානං වසාපන
අවහාරාද සෙවෙත්ති විඤ්ඤාතබ්බා විභාවිනා,

3 සාහත්ථාණත්තිකොචෙව නිස්සග්ගො අත්ථසාධකො
ධුරනික්ඛෙපනංචෙව ඉදංසාහත්ථිපඤ්චකං,

4 පුබ්බසහ පයොගොච සංවිදාහරණම්පිච
සංකෙත කම්මංනිමිත්තං පුබ්බයොගොති පඤ්චකං,

5 ථෙය්‍යාපසය්හ පරිකප්පා පටිච්ඡන්න කුසනාමිකා
අවහාරාඉමෙපඤ්ච විඤ්ඤාතබ්බා විභාවිනා,

සී ගාථා 5ක් බුරුම පොත්වලතිබේ-ලඞ්කාවේ පුරාණපොත්වල නොපෙනේ පාරාජික කණ්ඩ පඤ්චගාථා යනටීකාවේ නියමය වද නොගැලපේ, එහෙයින් එයග්‍රන්ථ කර්තෘගේ වැඩක්නොව පසුව යම්කිසිආචාර්යකෙනෙකුගේ යෙදීමක්යයිද එසේම 104ගා

ථාවලගට 'සම්මජ්ජනිපදීපොච, යනාදි පූර්වකරණයද 'ඡන්දපාරි
සුද්ධිඋතුක්ඛානං, යනාදි පූර්වකෘත්‍යයද 'උපොසථො යාවතිකා
ච භික්ඛූ, යනාදි ප්‍රාප්තකාලයද, පුබ්බකරණ පුබ්බකිච්චානි සමා
පෙත්‍වා, යනාදි නිගමන වාක්‍යයද, බුරුම පොත්වලතිබේ. පො
රාණ ටීකාවෙහි ඒගැණ කිසිත් වර්‍ණනාවක් නොපෙනේ. අභි
නවටීකාවෙහිසෙසපාඨ වසයෙන්කියාතිබේ. එබැවින් හෙදකතී
ගේ සඞ්ග්‍රහයක්නොවපසුව යම්කිසි ආචාර්‍ය්‍යකෙනෙක්විසින් සඞ්ග්‍ර
හකරණ ලද්දකැයිහැඟි අපවිසින් සකස්කරණලද මේපොතට ඒ
සඞ්ග්‍රහනොකරණලදී-කාලයක පටන් ලිපිදෙසවලින් ගහනාව ර
ටිත්රට ඒඒපොත් එකකටඑකක් නොගැලපීමෙන්ද අපප්‍රමාද භ්‍ර
මාදියෙන් සඤ්ජාතවූද තවත්අශුද්ධතැන් මෙහිඇතිවෙන්නට පුලු
වනඒපණ්ඩිතයන්විසින් ලොකාර්‍ථසංසිද්ධියපිණි සශුද්ධකරණුලැබේවා.

නැවත අච්චුගස්වා ප්‍රසිද්ධකිරීමේ අයිතිවාසිකම මෙහිමූලනම්
ජේන අපවෙතම තබාගත්බවසියළුදෙනාවිසින්ම දැනගතයුතුයි.

වර්‍ෂ 1887ක්වූ ජූනිමස 20වෙනිදින ගාල්ලේදීය.

1 ජිනෙන්ද්‍රදයාදිවරදං සුම්ගන්ධවුත්තං
ජනාපාධිතං ඉතරසත්ත විතානකෙහි
උලෙලාලජාල මවිලඞ්ඝිය සාලවෙලං
වන්දෙ පසන්නාර්ථතං මුනිරාජ සින්ධුං;

2 මුත්තාගුණං සුපරිභොග මනොමකාන්තං
බන්ධුරතනත්ත මලලාභ පපූණ්ණමග්ගං
කල්‍යාණසත්ත කලම්බගල වත්ථුභූතං
සද්ධම්මදිබ්බ සරිතං විරතංභජාමි;

3 බද්ධංගුණෙන සකලෙන මධුංදදන්තං
නොලිම්පිතං සතතපාප කදම්බකෙහි
සංසෙහි සෙවිතමනග්ඝ සුසීලගන්ධං
සංඝාරවින්ද ගහණං සිරසාභිවන්දෙ,

4 ජන්තුනිකාය මභියානක බන්තිකන්තා
කන්තාදරා සුභධරා යතිසංඝඉන්දා,
ඉන්දසභාදි වරියා විබුධාභිනන්දා
නන්දන්තා පරමසන්ති පදංලභන්තු,

5 සික්ඛායමූල පදමාදිගතාසිමාය
ව්‍යාඛ්‍යාත මඤ්ඤිහි පූරණ තරංගිල්ගං
භාවත්ථ මෙවනභිමාධු නිකායතාතු
සාඛෙතිසොතු ඒනභාය යතොතුතුසිං;

6 ගාල්වාභිධාන නගරස්ස සමීපභූතෙ
අක්මීමනවිහ පවිතෙ උවරෙතුගාමෙ
ආරාධිතො යතිවරෙන තතොසුනන්ද
රාමාදිනිස්ස විදිතෙන හිසාදරෙන,

7 ටීකානයං අනුවිලොකිය සබ්බගන්ථා
පොරාණකෙහි සුවිනිච්ඡිත මත්ථසාරං
ව්‍යාඛ්‍යානිමං අභිනවං සුගමංකරිස්සං
ගණ්හන්තු සුතා මිධසජ්ජනතා සපඤ්ඤා.

# මූලසික්ඛා සන්නය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1 නත්වා නාථං පවක්ඛාමි මූලසික්ඛං සමාසතො
භික්ඛූනා නවකෙනාදෙ මූලභාසාය සික්ඛිතුං

---

1 නාථං, (යාවන උපතාප ඉස්සරිය ආසිංසනයන චතුර්විධ නාථාඞ්ගයෙන් යුක්තවූ) භාග්‍යවතුන්වහන්සේට; නත්වා, (කායවචීමනොද්වාරයෙන්) නමස්කාරකොට; ආදෙ, ආදියෙහි; නොහොත් උපසම්පන්නවූ තැන්පටන්; නවකෙන භික්ඛුනා, අලුත්මහණපැවිදිලත්භික්ෂුව විසින්; සික්ඛිතුං, හික්මෙනු පිණිස; *මූලභාසාය මූලභාෂානම්වූ මාගධභාෂාවෙන්; මූලසික්ඛං, (අධිසීල අධිචිත්ත අධිප්‍රඥායයි කියනලද ත්‍රිවිධ සික්ෂාවන්ට මුල්වූබැවින් මූලසික්ෂා නම්වූ) අධිසීල සික්ෂාව; නොහොත් තදීපකවූ ග්‍රන්ථය, සමාසතො, සංක්ෂෙපයෙන්; පවක්ඛාමි, ප්‍රකාරයෙන්කියමි-

උපසම්පන්නස්ස සුප්පතිට්ඨිත භාවසාධනෙන මූලාවසා සික්ඛිතබ්බතො සික්ඛාචාති මූලසික්ඛා, යනුවෙන් උපසම්පන්නයාගේ සුප්‍රතිෂ්ඨිතභාවය සිදුකිරීම් අර්ථයෙන් මුල්වූවාත් ඕමය හික්මියයුතුහෙයින් සික්ෂාවූවාත් ඕමනුයි මූලසික්ෂායි- පතිට්ඨිතෙන මූලංසික්ඛිතබ්බෙනසික්ඛා, මූලංසික්ඛා එත්ථාති මූලසික්ඛා, ප්‍රතිෂ්ඨාර්ථයෙන් මුල්ය හික්මියයුතු අර්ථයෙන් සික්ෂාය, මුල්වූ සික්ෂාමෙහිනුයිමූලසික්ෂායි;'ධාතූපචාරයෙන් ප්‍රකරණයකියනුලැබේ'-තවද

'සඤ්ඤානිමිත්තං කත්තාචපරිමාණං පයොජනං
සබ්බාගමස්ස පුබ්බෙව වත්තබ්බංවත්තුවිචක්ඛණා'යි

සන්දර්ශිතහෙයින්, නත්වානාථංපවක්ඛාමි. යනාදි ගාථාවෙන් ප්‍රණාමසහිතවූ පූර්වපක්ෂචකය දක්වනලදී-එහි 'නත්වානාථං' යන්නෙන් ප්‍රණාමයි 'පවක්ඛාමි, යන උත්තම පුරුෂෙකවචන යුක්තීන් අධ්‍යාහාර කරණලද (අහං) යන්නෙන් කර්තෘයි; (මූලසික්ඛං) යන්නෙන් සංඥායි; සමාසතො, යන්නෙන් ප්‍රමාණයි, ප්‍රයොජනයද, එපින්මසාමර්ථ්‍යයෙනි, ආදෙසික්ඛිතුංභික්ඛුනා, යන්නෙන් නිමිත්ත දක්වනලදී; මූලභාසාය, යනු ආධ්‍යාත්මික කරණයි; පසනෙන න මනසාභාසති, යන්නමෙනි-මෙසේ ප්‍රණාම සහිතවූ සංඥාදිපූර්වපක්ෂචකය දක්වා දැන් ප්‍රතිඥාත ප්‍රකරණය කරණු පිණිස (සඤ්ඤානිමිත්තං) යනාදිය කියයි-

---

*සික්ඛිතුං යන්නාගැණ, (සික්ඛාපයිතුංයී) අභිනව ටීකාවෙහි දක්වනලදබැවින්, ආදෙ, ආදියෙහි; නවකෙන භික්ඛුනා, නවකභික්ෂූවලවා සික්ඛිතුං, හික්මවීමපිණිස; මූලභාසාය, මූලභාෂාවෙන්;යී කියාත් අර්ථකියයුතුවේ;-

2 සනිමිත්තං පවෙසෙන්තො භික්ඛු මග්ගත්තයෙ චුතො
පවෙසනට්ඨිතුද්ධාර පවිට්ඨෙ වෙ පිසාදියං

3 අදින්නං මානුසං භණ්ඩං ථෙය්‍යායෙකෙන ආදියං
පඤ්චවීසාව හාරෙසු ගරුකඤ්චෙචුතො හවෙ

4 මනුස්සපාණං පාණොති ජානංවධක චෙතසා
ජීවිතායො වියොජෙති සාසනාසො පරාජිකො.

2 සනිමිත්තං, තමන්ගේ නිමිත්ත; මග්ගත්තයෙ, මාර්ගත්‍රිත යෙහි; පවෙසෙන්තො ප්‍රවෙශකරන්නාවූ; භික්ඛු, මහණතෙම; පවෙසනට්ඨිතුද්ධාර පවිට්ඨෙ, ප්‍රවෙශනය;ස්ථිතිය, උද්ධාරය; ප්‍රවිෂ්ටය;යනාමෙහිදී; වෙපි, ඉදින් වනාහී; සාදියං, ඉවසන්නේ; චුතො, චුත වූයේයි; හෙවත් පරිජිවූයේයි-

3 අදින්නං, කයින් වචසින් නුදුන්නාවූ; මානුසං, මනුෂ්‍යයන් සතුවූ; ගරුකං, ගරුවූ; හෙවත් මසුපසක්හෝ ඉන්වැඩියක් අගනාවූ; භණ්ඩං, වස්තුවක්; ථෙය්‍යාය, සොරසිතින්;* පඤ්චවීසාව හාරෙසු, පස්විසි අවහාරයන් අතුරෙන්; එකෙන එක්අවහාරය කින්; ආදියංචෙ,(යම් භික්ෂුවක්තෙම)ගන්නේවීනම්; චුතොහවෙ, (හේතෙම ශාසනයෙන්) චුතවූයේ (වෙ)යි-

4 යො, යම්භික්ෂුවක්තෙම; පාණොඉති, ප්‍රාණියෙකැයි; ජානං, දන්නේ; වධකචෙතසා, වධකචිත්තයෙන් හෙවත් නොහොත් මරණ අදහස් ඇතිව; මනුස්සපාණං, (කලලරූපය පටන් ජීවත්වනමනුෂ්‍යශරීරයක්; ජීවිතා, ජීවිතෙන්ද්‍රියෙන්; වියොජෙති, වෙන්කෙරේද;† සො, ඒ (මහණ)තෙම; සාසනා, ප්‍රතිපත්ති ශාසනයෙන්; පරාජිකො, පරාජයවූයේ(වෙ)යි-මෙහි මනුස්සපාණංයි දක්වනලද බැවින් මනුෂ්‍ය නොවන ප්‍රාණියක් මැරීමෙන් පාරාජිකාපත්ති නොවනබව ප්‍රකාශිතයි-

*ථෙය්‍යායථෙය්‍ය චිත්තෙනාතිද, ථෙය්‍යායාතිලිඞ්ග විපල්ලාසොවා චිත්තෙනාති සම්බන්ධිතබ්බො ථෙය්‍යචිත්තෙනාති අත්ථො, ථෙය්‍යෙනෙකෙනාති පිපාඨො යනු අභිනව ටීකාවයි

†ප්‍රාණිය ජීවිතෙන්ද්‍රියයෙන් වෙන්කිරීමනම්, සාහත්ථික, නිස්සග්ගික, ආණත්තික, ථාවර, සෘද්ධිමය;විජ්ජාමය, වශයෙන් සවැදෑරුම්වේ, එහි සියතයින් හෝ කායප්‍රතිබද්ධ යමකින්හෝ මරන්නාහට සාහත්ථික ප්‍රයොගවේ, දුරසිටියහු මැරීමට ඊඅඩයටි ආදින්හරින්නාහට නිස්සග්ගිකප්‍රයොගවේ, අසවලා මරවයි යනාදියෙන් අණකරන්නාහට ආණත්තික ප්‍රයෝගයවේ, වලවල්කැණීම් කඩුආදියවෙත තැබීම් ආදිය ථාවර ප්‍රයෝගවේ, මරණු පිණිස කර්මවිපාකජ සෘද්ධියක් යෙදීම සෘද්ධිමය ප්‍රයොගවේ; අනුන්මරණු පිණිස මන්ත්‍රජපකිරීම විජ්ජාමය ප්‍රයොගවේ-

5 ඣානාදිභෙදංහදයෙ අසන්තංඅඤ්ඤාපදෙ සඤ්චවිනාධිමානං
මනුස්සජාතිස්සවදෙය්‍යභික්ඛුඤාතක්ඛණෙතෙනපරාජිකොති*
පාරාජිකා නිද්දෙසො

6 මොචෙතුකාම විතෙතන උපක්කමෙව විමොචයං
සුක්කමඤ්ඤත්‍රසුපිනාසමණො ගරුකම්ඵුසෙ.

---

5 භික්ඛු,(යම්) භික්ෂුවක්තෙම; අඤ්ඤාපදෙසඤ්ච, අනිකෙක්හු ගේ නීමද; අධිමානඤ්ච, අධිගතයයි උපන් මානයද; විනා, හැර; හදයෙ, (තමාගේ) සිත්හි;අසන්තං, නැත්තාවූ; ඣානාදී භෙදං, ධ්‍යානය ආදිප්‍රභෙදඇති උත්තරි මනුෂ්‍ය ධර්මය; මනුස්සජාතිස්ස, මිනිස්ජාති ඇත්තෙක්හට, වදෙය්‍ය, කියානම්; තෙන, ඒමිනිස්ජාතිඇත්තහු විසින්; ඤාතක්ඛණෙ, දත්කෙණෙහි; හෙවත් සිතින් අදහාගත් ක්ෂණයෙහි; ලෙහෝ නොහොත් ඤාතක්ඛණෙ, අව බොධකළ ඇසිල්ලෙහි; තෙන, ඒශාසනයෙන්; පරාජිකොති (ඒ මහණතෙම) පැරදුනේම (වෙ)සි†-පාරාජිකා නිද්දෙසො, පාරාජිකානිර්දෙශය(නිමියේ)යි-

(ඉක්බිති සඞ්ඝාදිසෙස ආපත්තීන් දක්වනු පිණිස 'මොචෙතු කාමචිතෙතන, යනාදිය කියයි-)

6 මොචෙතු කාමචිතෙතන, මුදවනුකැමති සිතින්;‡ උපක්ක මෙව, උපක්‍රමකොට; සුක්කං, ශුක්ලය; විමොචයං, මුදවන්නාවූ; සමණො, ශ්‍රමණතෙම; සුපිනා, ස්වප්නයෙහිවන ශුක්ලමොචන ය;§ අඤ්ඤත්‍ර, හැර; ගරුකං, (උත්ථානයාගේ ගරුකත්වයෙන් ග රුකනම්වූ) සඞ්ඝාදිශෙෂාපත්තිය; ඵුසෙ, ස්පර්ශකෙරෙයි; නොහො ත් පැමිණෙයි-

---

*ලඞ්කාවේ පොත්හි, පරාජිකොති,යිද; බුරුමාක්ෂර පොත්හි පරාජිකොසොයිද, පරාජිකො භවෙයිද, පාරාජිකායිද, ඉඞ්ග්‍රීසි අ කුරෙන් අච්චුගසනලද පොතෙහි, පරාජිකොච සොයිදතිබේ- ඉතින්මෙහි පරාජිකොචසො යනුද; පරාජිකොභවෙ යනුද, පා රාජිකා යනුද ප්‍රමාද පාඨයෝයයි හඟිම් මක්නිසාද, මේවෘත්තිය ඉන්ද්‍රවජ්‍රායි, එකොළොස් අකුරකින් පදයෙක්වෙයි,අකුරු දොළොස් ක්උව වෘත්තිය භෙදවන හෙයිනි-

† සමහර බුරුමාක්ෂරපොතක තිබෙන ප්‍රකාරයට (පරාජිකො සො)යයි කිවද නිරවද්‍යයි, එසේකල, සො, ඒ (මහණ)තෙම, පරා ජිකො, පැරදුනේ(වෙ)සිකියා අර්ථබිණියයුතුවේ-

‡ මොචෙතුකාමචිතෙතන, යනු ඉත්ථම්භූතයෙහි කරණයි-

§ සුපිනා, යනු කර්මාර්ථයෙහි නිස්සක්කවචනයි-

7 කායසංසග්ගරාගෙන මනුස්සිත්ථිං පරාමසං
ඉත්ථිසඤ්ඤීඋපක්කම්ම සමණොගරු කම්පුසෙ
8 දුට්ඨුල්ල වාචස්සාදෙනමග්ගං වාරබ්භමෙථුනං
ඔභාසන්තො මනුස්සිත්ථිං සුණමානං ගරුම්පුසෙ
9 වණ්ණංවත්වාත්තනොකාම පාරිචරියාය මෙථුනං
ඉත්ථිංමෙථුන රාගෙන යාචමානො ගරුම්පුසෙ.
10 සන්දෙසංපටිග්ගණ්හිත්වා පුරිසස්සිත්ථියාපිවා
වීමංසිත්වා හරංපච්ඡා සමණො ගරු කම්පුසෙ.

---

7 සමණො, ශ්‍රමණතෙම; ඉත්ථිසඤ්ඤී, මනුෂ්‍යස්ත්‍රියයිසංඥාඇ
ත්තේ; කායසංසග්ග රාගෙන, කාය සංසර්ගරාගයෙන්; හෙවත්
හස්තග්‍රහණාදි කායස්පර්ශරාගයෙන්; උපක්කම්ම; උපක්‍රමකොට;
මනුස්සිත්ථිං, මිනිස්මාගම; පරාමසං, පරාමර්ශනය කරන්නේ; ග
රුකම්පුසෙ, ගරුකාපත්තිය ස්පර්ශකෙරේ, හෙවත් සංඝාදිසෙසා
පත්තියට පැමිණේ-

8 දුට්ඨුල්ල වාචස්සාදෙන, මෛථුනධර්ම ප්‍රතිසංයුක්තවාක් අ
ස්වාද(රාග)යෙන්; මග්ගංවා, වර්චස්මාර්ග යෝනිමාර්ගයන් අතු
රෙන් එක්තරා මාර්ගයක්හෝ; මෙථුනංවා, මෛථුන (ධර්ම)යහෝ;
ආරබ්භ,අරභයා, හෙවත් උදෙසා; සුණමානං, අසන්නාවූ;* මනුස්සි
ත්ථිං, මිනිස්මාගමකට; ඔභාසන්තො, (යම්ශ්‍රමණයෙක්තෙම)අසභ්‍ය
වචනප්‍රකාශකරන්නේ; ගරුම්පුසෙ, ගරුකාපත්තියස්පර්ශකෙරේ

9 අත්තනො, තමහට;කාම්පාරි චරියාය, කාමයෙන් මෙහෙ
කිරීමෙහි; වණ්ණංවත්වා, ගුණකියා; මෙථුනරාගෙණ, මෛථුන
රාගයෙන්; ඉත්ථිං, මාගමක අතින්; † මෙථුනං, මෛථුනය; යාච
මානො,යාච්ඤාකරන්නේ;ගරුම්පුසෙ,ගරුකාපත්තියස්පර්ශකෙරේ

10 පුරිසස්සවා, පුරුෂයාගේහෝ;ඉත්ථියාපි මාගමකගේහෝ; ස
න්දෙසං,(කෙලෙස්පිළිබඳකොට කියනලද)හස්නක්,පටිග්ගණ්හිත්වා,
පිළිගෙණ; විමංසිත්වා,(යමෙක් සඳහායවනලදද ඔහුවෙතගොස්
අදහස්) පරීක්ෂාකොට; පච්ඡාහරං, (ඔහුගේ සන්දෙශ වචනය,)ප
සුව ගෙණයන්නාවූ; සමණො, ශ්‍රමණතෙම; ගරුකම්පුසෙ, ගරු
කාපත්තිය ස්පර්ශකෙරේ-

---

* සුණමානන්ති වුත්තත්තා අසුණන්තියා පනදූතෙන වාප
ණ්ණෙනවා ආරොචිතෙ අනාපත්ති යනු අභිනවටීකායී-සුණමානං
යී කියනලදබැවින් නොඅසන්නියට වනාහි දූතයෙක් ලවාහෝ
ලිවූව් පත්‍රයකින්හෝ ආරොචනය කළකල්හිසංඝාදිසෙසආපත්ති
නොවේ, යනුයි-

† ඉත්ථිං යනුකර්ම විභක්ත්‍යන්ත පදයි-මෙයට මාගමක් අතින්
යයි සිංහලභාෂාවිභක්තිව්‍යවහාරයෙහි යෙදෙනලෙස අර්ථකීයෙමු-

11 චාවෙතුකාමො වො දෙනෙතා අමූලකෙනන්තිමවත්ථුනා
චොදාපයං වා සමණො සුණමානං ගරුම්පුසෙ
12 ලෙසමත්ත මුපාදාය අමූලන්තිම වත්ථුනා
චාවෙතුකාමො චොදෙනෙතා සුණමානං ගරුම්පුසෙ
ගරුකාපත්තිනිද්දෙසො ———
13 විකප්පන මධිට්ඨාන මකත්වාකාල චීවරං
දසාහමති මාපෙති තස්සනිස්සග්ගියංසියා.

11 චාවෙතුකාමො (බ්‍රහ්මචය්‍යීායෙන්) චුතකරවනු කැමතිවූ, සමණො, ශ්‍රමණයෙක්තෙමේ; අමූලන්තිම වත්ථුනා, (දෘෂ්ටශ්‍රුතපරිසඞ්කිත සඞ්ඛ්‍යාත මූල්නැතිහෙයින්) අමූලකවූ; පාරාජිකාසඞ්ඛ්‍යාතවස්තුවකින් සුණමානං, අසමින්සිටි භික්ෂුවකට; චොදෙන්තොවා,(තෙමේ) චොදනාකරන්නේහෝ; චොදාපයංවා, (අනුන් ලවා) චොදනා කරවන්නේහෝ, ගරුම්පුසෙ, ගරුකාපත්තිය සපර්ශිකෙරේ-

12 ලෙසමත්තං, ජාත්‍යාදිදසවිධ ලෙසයන්ගෙන් එක්තරා ලෙසමාත්‍රයක්,* උපාදාය, රැගෙණ, නොහොත් නිසාචාවෙතුකාමො,බ්‍රහ්මචය්‍යීායෙන්චුතකරවනුකැමැත්තේ;අමූලන්තිමවත්ථුනා අමූලක අන්තිම වස්තුවකින්; සුණමානං, අසමින්සිටි භික්ෂුවකට; චොදෙන්තො, චොදනාකරන්නේ; (අනන්තරගාථායෙන්) චොදාපයන්වා, යනු අනුවෘත්තිත බැවින්)වා, නොහොත්; චොදාපයං (අනුන්ලවා) චොදනාකරවන්නේ; ගරුම්පුසෙ, ගරුකාපත්තිය සපර්ශිකෙරේ-
(ගරුකාපත්තිනිද්දෙසො,ගරුකාපත්තීන්ගේනිර්දේශයනිමියේයි)

13 අකාලචීවරං, අකල්සිවුරක්;† විකප්පනං, විකප්පනයද; අධිට්ඨානං, ශුට්මද; අකත්වා, නොකොට; දසාහං, දසදවසක්; අති

* දසවිධලෙසනම්; ජාති,නාම; ගොත්ත, ලිඞ්ග, ආපත්ති, පත්ත,චීවර, උපජ්ඣාය, ආචරිය, සෙනාසන, යනාදසයයි-ලෙසමාත්‍රනම්,අන්‍යක්වස්තුවක්ව්‍යවහාරමාත්‍රයකින් වැලඳගන්නාපමණකි
† කඨිනය නොඅතුළකල්හි පවුරුණු මාසයාගේ ශුක්ලපක්ෂ පඤ්චමියපටන් පවුරුණුදිනදක්වා අවෙමකචීවර කාලයවූ එකොළොස්දිනහා වස්සානයාගේ පශ්චිම මසද කඨිනය අතුළහොත් යථොක්ත එක්මස් එකොළොස්දින සහ හෙමන්තික සාරමසද යන පස්මස් එකොළොස්දින චීවරකාලසමයයි-ඉන්පිටත් මාසයන්හි ලබනලද චීවර අකාල චීවර නම්-

14 භික්ඛුසම්මුතියාඤ්ඤත්‍ර තිචීවරමධිට්ඨිතං
එකාහමති මාපෙති නිස්සග්ගියි සමයංවිනා
15 අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණ චීවරමපනා
ධොවාපෙති රජාපෙති ආකොටාපෙති නංසියා
16 අඤ්ඤාතිකා භික්ඛුනියා හත්ථතොචීව මූලකං
අදත්වාචිවරාදානෙ නිස්සග්ගිය මුදීරිතං

---

මාපෙති, (යම්භික්ෂුවක්තෙම) ඉක්මවානම්; තස්ස, ඒභික්ෂුවට; නිස්සග්ගියං, නිසග්ගි (පචිති) සියාවෙයි--*

14 භික්ඛුසම්මුතියා අඤ්ඤත්‍ර, භික්ෂුසම්මුතියක් නැතිව; සමයංවිනා, චිවරකාලයහැර; අධිඨිතං; (චිවරනාමයෙන්)ඉටනලද; තිචිවරං, තුන්සිවුරෙන්;† එකාහං, එකදවසක්; අතිමාපෙති, (ගමෙක්) ඉක්මපවත්වානම්; නිස්සග්ගියි, (ඕහට) නිසග්ගි(පචිතිවෙ)යි

15 අඤ්ඤාතිකා භික්ඛුනියා, නොනෑ මෙහෙණින්නක්ලවා;‡ පුරාණ චිවරමපන, (මදකුදු වැලඳගැන්ම හෙතුකොටගෙණ) පරණවූ සිවුරක් වනාසි; ධොවාපෙතිවා, (යම්භික්ෂුවක්තෙම) සෝදුවානම්හෝ, රජාපෙතිවා රඳන්කරවානම්හෝ; හෙවත් පඬුපෙවිම් කරවානම්හෝ; ආකොටා පෙතිවා, (සිලාමය දුරුමය පෝරුආදියක) ගස්සවානම්හෝ; නංසියා, (ඒභික්ෂුවට) ඒපළමු නිසග්ගියසි දක්වනලද ආපතනිවෙයි-

16 චිව්මූලකං, මාරුකිරීම් වශයෙන් දියයුතු යම්කිසිවක්; අදත්වා,¶ නොදී; අඤ්ඤාතිකාභික්ඛුනියා, නොනෑ මෙහෙණියකගේ; හත්ථතො, අතින්; චිවරාදානෙ, සිවුරුගැන්මෙහි; නිස්සග්ගියං, නිසග්ගි (පචිති) උදීරිතං, කියනලදී-

---

* නිස්සග්ගියනාතියංවුත්තං නංසුණොසි යථාතථං සඞ්ඝමජ්ඣෙගණමජ්ඣෙඑකෙකස්සෙ වඑසතොනිස්සජ්ජිත්වාන දෙසෙති තෙනෙතංඉතිවුච්චතිති-'යත්තෙන්නිස්සග්ගියං'යත්නාතෝරුම්කරණලදී-එහිඅදහස නිස්සග්ගියංසි යමක් කියන ලද්දේද එයයම්සේවේනම් ඒවත්නාවූ පරිදී අසව සඞ්ඝයා මධ්‍යයෙහිද ගණමධ්‍යයෙහිද එකක් එකක්හුගේ මධ්‍යයෙහිමද ඒක්වීමෙන් නිශදූ හෙවත් බාරකිරීම් වසයෙන්දි (ඇවැත්) දෙසයි එහෙයින් මේ නිස්සග්ගියං යන්න මෙහෙයින් නිස්සග්ගියයි කියනුලැබේ-

† තිචීවර මධිසිතං යනු කරණාර්ථයෙහි කර්ම්විභක්තියි.

‡ අඤ්ඤාතිකාය නතත්හි(පටිසඞ්ඛායොනිසො)යනුවෙන්යකාරලොපයහෝ ගාථාබන්ධසැපයපිණිසම්බන්ධයෙන්දීකියහෝදතයුතු

¶ වාශබ්දය ගම්‍ය මානාර්ථහෙයින්හෝ ඡන්දනුරක්ෂණයනිසාහෝ ගාථායෙහි නොයොදනලදී.

17 අප්පවාරිතමඤ්ඤාතිං විඤ්ඤාපෙන්තස්සචීවරං
අඤ්ඤාත්‍රසමයා තස්සනිස්සග්ගියමුදීරිතං
18 රජතං ජාතරූපංවා මාසකංවා කහාපණං
ගණ්හෙය්‍යවා ගණ්හාපෙය්‍ය නිස්සග්ගිසාදියෙය්‍යවා.
19 පරිවත්තෙය්‍යනිස්සග්ගී රජතාදි චතුබ්බිධං
කප්පියංකප්පියෙනාපි ඨපෙත්වා සහධම්මිකෙ.

---

17 අප්පවාරිත මඤ්ඤාතිං, නොපැවරූ නොනෑගිහියෙක් අතින්;* චීවරං, සිවුරක්; සමයා අඤ්ඤත්‍ර,නිසිවූකාලයහැර;† විඤ්ඤාපෙන්තස්ස, ඉල්වනනාවූ; තස්ස, ඕහට; නිස්සග්ගියං, නිසගි (පචිති) උදීරිතං, කියනලදී-

18 රජතංවා, රිදීහෝ; ජාතරූපංවා, රන්රන්හෝ; මාසකංවා, මසුහෝ; කහාපණංවා, කහවණුහෝ;‡ ගණ්හෙය්‍යවා, (තෙමේ) ගණී නම්හෝ; ගණ්හාපෙය්‍යවා,(තමාපිණිසඅනුන්ලවා) ගන්වා නම්හෝ; සාදියෙය්‍යවා, (කයින් වචසින් ප්‍රතික්‍ෂෙපනොකොට සිතින්) ඉවසා නම්හෝ; නිස්සග්ගි, (ඕහට) නිසගි (ඇවැත්වෙ)යි.

19 රජතාදි චතුබ්බිධං, රජතාදී චතුර්විධය; (එනම්) රිදී රන් රන් මසු කහවණුයන සතරවැදෑරූම් දෙය; පරිවත්තෙය්‍ය, (අනිකකින්) පෙරළීම කෙරේනම්; හෙවත් මාරුකෙරේනම්; නිස්සග්ගි, (ඕහට) නිසගි(වෙ)යි; සහධම්මිකෙ, පස්සඟ දැමියන්;§ ඨපෙත්වා, හබා; කප්පියං, කැපවස්තුවක්; කප්පියෙනාපි, කැප වස්තුවකින්ද; (පරිවත්තෙය්‍ය යනුද; නිස්සග්ගි, යනුද, යටින්වැටේ) පරිවත්තෙය්‍ය, පෙරළානම්: නිස්සග්ගි, (ඕහටද) නිසගි(වෙ)යි ¶

---

* මේ අවධි විභක්තියට නගා අර්ථකථනය ගැණ 7 ගාථාවේ 'ඉත්ථිං' යන්නගේ අර්ථකථනයගැණ දැක්වූ අධෝලිපිය බලනු.

† නිසිවූ කාලයනම් අච්ඡින්නචීවර නෂ්ටචීවර ඇති කාලයයි එකල්හි තෙමේ ඉල්වන්නේද අනිකෙක්ලවා ඉල්ලවන්නේද ඇතා පතාතියි.

‡ ලොහමාසකය, දාරුමාසකය, ජතුමාසකයයි මාසක් තුන් කොටසෙකි, එහි තඹ ලොහාදියෙන් කළමසු ලොහමාසක නම්, දරඅරටුවෙන්හෝ උනපතුරු කැබලිඥෙකින්හෝ යටත්පිරිසෙයින් රූපසිඳ තල්පතකින්හෝ කළමසු දාරුමාසකනම්, ලාකඩින් හෝ මැලියමින් හෝ රූපනගා කළමසු ජතුමාසකනම්, මාසක ගෙණින් මසු විස්සක් කහවනුවයි.

§ පස්සඟදැමියෝනම්භික්‍ෂු,භික්‍ෂුනී, සාමණේර, සාමණේරී සික්‍ෂමානා, යන පස්කොටසයි.

¶ පොරාණටීකාණයෙහි මේගාථාවට කරණලද, අර්ථවිවරණය මෙයට විරුද්ධයි.

20 විකප්පනමධිට්ඨාන මකත්වාන පමාණිකං
දසාහමති මාපෙති පත්තං නිස්සග්ගියං සියා.

21 පඤ්චබන්ධනතො ඌන පත්තෙ සති පරම්පන
විඤ්ඤාපෙති නවම්පත්තං තස්ස නිස්සග්ගියං සියා

22 පටිග්ගහෙත්වා භුඤ්ජන්තො සප්පිතෙලාදි කම්පන
සත්තාහමතිමාපෙති තස්ස නිස්සග්ගියං සියා

23 භික්ඛුස්ස චීවරං දත්වා අච්ඡින්දන්තස්ස තම්පුන
සකසඤ්ඤාය නිස්සග්ගි අච්ඡින්දාපයතොපිවා

24 අප්පවාරිත මඤ්ඤාතිං සුත්තං යාචිය චීවරං
වායාපෙන්තස්ස නිස්සග්ගි විනාඤාති පවාරිතෙ

---

20 විකප්පනං, (ඉමං පත්තං තුය්හං විකප්පෙමි යනාදියෙන්) විකප්පනයද; අධිට්ඨානං, (ඉමං පත්තං අධිට්ඨාමි යනාදියෙන්) ඉටීමද; අකත්වාන, නොකොට; පමාණිකං, ප්‍රමාණයෙන් යුක්තවූ; පත්තං, පාත්‍රයක් නොහොත් පාත්‍රයෙන්;*දසාහං, දසදවසක්; අතිමාපෙති, ඉක්මවානම්; නිස්සග්ගියං සියා, (ඕහට) නිසගි(ඇවැත්වෙ)යි

21 පඤ්චබන්ධනතො, පස්බැඳුමකින් හෙවත් පිළියම්පසකින්; ඌනපත්තෙ සති, අඩුපාත්‍රය ඇතිකල්හි; පරං, අනික්; නවං පත්තං පන, අලුත්පාත්‍රයක් වනාහි; විඤ්ඤාපෙති, (නොනෑ නොපැවරූවන්ගෙන්) ඉල්වාගණී නම්; තස්ස, ඕහට; නිස්සග්ගියං සියා, නිසගි (ඇවැත් වෙ)යි-

22 සප්පිතෙලාදිකම්පන, ගිතෙල් තලතෙල් ආදිය වනාහි; (ආදිශබ්දයෙන් වෙඬරු මීපැනි උක්සකුරු) පටිග්ගහෙත්වා, පිළිගෙණ; භුඤ්ජන්තො, වලඳන්නේ; සත්තාහං, සතියක්; අතිමාපෙති, ඉක්මවානම්; තස්ස, ඕහට; නිස්සග්ගියං සියා, නිසගිවෙයි-

23 භික්ඛුස්ස, භික්ෂුවකට; චීවරං, සිවුරක්; දත්වා, දී; පුන, නැවත; තං, ඒ(සිවුර) සකසඤ්ඤාය, තමන්ගේය යන සංඥායෙන්; අච්ඡින්දන්තස්සවා, පැහැරගන්නාහටද; අච්ඡින්දාපය තොපිවා, අනුන්ලවා) පැහැරගන්වනු, තැනැත්තාටද; නිස්සග්ගි, නිසගිවෙයි

24 අප්පවාරිතං, නොපැවරූ; අඤ්ඤාතිං, නොනෑ(ගෘහපති)යෙක්අතින්; සුත්තං, නූල් යාචිය ඉල්වාගෙණ; ඤාතිපවාරිතෙ විනා, නෑපැවරූවන් හැර; චීවරං, සිවුරක්; වායාපෙන්තස්ස, වියවන්නාහට; නිස්සග්ගි, නිසගි (වෙ)යි-

---

* මේගැණ 14 ගාථාවේ තිච්වරං, යන්න ගැණ දැක්වූ අඩොලිපිය බලනු-

25 ජානන්තො* භික්ඛුසඞ්ඝස්ස ලාභංපරිණතම්පන
අත්තනොපරිණාමෙති තස්සනිස්සග්ගියංසියා
නිස්සග්ගිය නිද්දෙසො-

26 සම්පජාන මුසාවාදෙ පාචිත්තිය මුදීරිතං
භික්ඛුඤ්ච ඔමසන්තස්ස පෙසුඤ්ඤහරණෙපිච
27 ඨපෙත්වා භික්ඛුනිං† භික්ඛුංඅඤ්ඤෙන පිටකත්තයං
පදසො ධම්මං භණන්තස්ස පාචිත්තිය මුදීරිතං

---

25 භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසඞ්ඝයාට; පරිණතං, පිරිනැමූ; ලාභම්පන, ලාභයක් වනාහි; හෙවත් චීවරාදි වස්තුවක් වනාහි; ජානන්තො, දන්නේ; අත්තනො, තමහට; පරිණාමෙති, පිරිනැමුම්කරවා නම්; තස්ස, ඕහට; නිස්සග්ගියංසියා, නිසඟිවෙයි-
නිස්සග්ගිය නිද්දෙසො, නිසඟි (පචිති)නිර්දේශය(නිමියේ)යි-

(ඉක්බිත්තෙන් පචිති ඇවැත් කියනුලැබේ.)

26 සම්පජාන මුසාවාදෙ, දැනදැන බොරුකීම නිමිත්තකොටගෙණ; පාචිත්තියං, පචිතිඇවැතෙක්යයි; උදීරිතං, කියනලදී; (පාචිත්තියමුදීරිතං යනුඉතිරි පදවලහාද සම්බන්ධයි) භික්ඛුං, භික්ෂුවකට; ඔමසන්තස්සච, සටනයකරණ භික්ෂුවහටද; (පචිතියයි කියනලදී) පෙසුඤ්ඤහරණෙපිච, කේලාම්වචන ගෙණයාමෙහිද; නොහොත් කේලාම්වචන ගෙණයාම නිමිත්තකොටගෙණද පචිති ඇවැතෙක්යයි කියනලදී×-

27 භික්ඛුනිභික්ඛුං, භික්ෂුනිභික්ෂු යනසමූහය; ඨපෙත්වා, තබා; අඤ්ඤෙන, අන්‍යපුද්ගලයෙක්හාසමග; පිටකත්තයං ධම්මං, පිටකත්‍රයධර්මය; පදසො, පදවශයෙන්; භණන්තස්ස, කියනභික්ෂුවට; පාචිත්තියං,(පදගණනායෙන්)පචිති(ඇවැත්)උදීරිතං,කියනලදී§

---

*ඇතම්පොතක 'ජානංයො'යි තිබේ-එකලැයො, යම්භික්ෂුවක් තෙම; ජානං, දන්නේ;යි අර්ථබිණිය යුතුවේ-

†භික්ඛුනිං,යි සමහර පොතකතිබේ-

×පාචිත්තියං ) පාචිත්තිය නතියංවුත්තං තංසුණාථ යථාතථං
යන්නගැණ } පාතෙතිකුසලං ධම්මං රියමග්ගං පරජ්ඣති
) චිත්තස්ස මොහණට්ඨානං තෙනෙතං ඉතිවුච්චතීති

යන්නෙන් කියනලදී-පාචිත්තියංයිකියා යමක් කියන ලද්දේද ඒ පාචිත්තියං යන්න තත්වූපරිද්දෙන් අසව් පචිති ඇවතට පැමිණීතැනැත්තේ කුසලධර්මය යම්හෙයකින් හෙලයිද, ආර්‍ය්‍යමාර්ගයට අපරාධකෙරෙයිද, එහෙයින් චිත්තයාගේ මූලාවට කාරණාවූ එය පාචිත්තියං,යි කියනුලැබේ-යනුභාවයි-

§පිටකත්තයං ධම්මං,යි කීහෙයින් බාහිර ධර්මයන්හි පදානුපදය කියන්නාහට අනාපත්තියි-

28 අනුපසම්පන්නේන නෙවසයිත්වාන තිරත්තියං
පාචිත්ති සහසෙය්‍යාය චතුත්ථත්ථඞ්ගතෙපුන
29 ඉත්ථියාඑකරත්තම්පි* සෙය්‍යංකප්ප යතොපිවා
දෙසෙන්තස්සවිනා විඤ්ඤුං ධම්මඤ්චඡ පදුත්තරිං
30 දුට්ඨුල්ලං භික්ඛුනොවජ්ජං භික්ඛුසම්මුතියාවිනා
අභික්ඛුනොව දන්තස්ස පාචිත්තිය මුදීරිතං
31 ඛණෙය්‍යවා ඛණාපෙය්‍ය පඨවිඤ්චඅකප්පියං
භූතගාමං විකොපෙය්‍ය තස්සපාචිත්තියංසියා

---

28 අනුපසම්පන්නෙනනෙව, අනුප සම්පන්නයෙක් හාසමගම;† තිරත්තියං, තුන්රැයක්; සයිත්වාන, සයනයකොට; චතුත්ථෙ, සතරවන දවස්හි; අත්ථඞ්ගතෙ, හිරු අස්තඞ්ගතවූකලැ; පුන, නැවත; සහසෙය්‍යාය, එක්ව සයනය කිරීමෙහි; පාචිත්ති, පචිති (ඇවැතෙක්)වේ. පාචිත්ති, යනුමත්තටද සම්බන්ධයි-

29 ඉත්ථියා, (යටත්පිරිසෙයින්; එදවස් උපන්නාවූද මිනිස්)මාගමක්හා; එකරත්තම්පි, එකරැයකුදු; සෙය්‍යංකප්ප යතොපිවා, (එකසෙනස්නෙහි) සයනයකරණ භික්ෂුවටද; ‡ විඤ්ඤුංවිනා, නුවණැති (මිනිස්පුරුෂ)යක්හු නැතිව; ඡපදුත්තරිං, සපදයකින් මත්තෙහි§: ධම්මං, ධර්මය; දෙසෙන්තස්සච,(මාගමකට)දෙශනාකරණ භික්ෂුවටද; (පචිති) ඇවැතෙක්වේ-

30 භික්ඛුනො, භික්ෂුවක්හුගේ; දුට්ඨුල්ලංවජ්ජං, සඞ්ඝාදිසෙසාපත්තියක්; භික්ඛුසම්මුතියාවිනා, භික්ෂුසම්මුතියක්නැතිව; අභික්ඛුනො, අනුපසම්පන්නයෙක්හට; වදන්තස්ස, කියනභික්ෂුවට; පාචිත්තියං, පචිති(ඇවැත්)උදීරිතං, කියනලදී-

31 අකප්පියං, අකපවූ; පඨවිඤ්ච, පොළොවද; ඛණෙය්‍යවා (අකපබව දැනදැන තෙමේ) සෑරුයේනම්හෝ; ඛණාපෙය්‍ය වා, (අනුන්ලවා) සෑරවූයේනම්හෝ; (ඕහට පචිති ඇවැත්වේ) භූතගාමං, (වෘක්ෂලතාදී)භූතසමූහය; විකොපෙය්‍ය, (සිඳුම්බිඳුම්ආදී වසයෙන්)විනාසකෙරේනම්; තස්ස, ඕහට; පාචිත්තියංසියා, පචිති (ඇවැත්)වෙයි×-(තස්සසියා, යනුමත්තටද සම්බන්ධයි-)

---

*එකරත්තිම්පි’යී පාඨය.
†මෙයින් යටත්පිරිසෙයින් පාරාජිකවස්තුවූතිරශ්චීනයාද ගතයුතු
‡ දෘශ්‍යමාන රූපය ඇත්තාවූ යක්ෂනීප්‍රෙතීහුද, පණ්ඩකයාද, මෛථුනවස්තුවූ තිරශ්චීන ස්ත්‍රීහුද, මෙහිදුස්කෘත වස්තූහුයි-
§මෙහිපදනම්, එක්ගාථාපදයනි ‘එකොගාථාපාදො, එකපදන්නියනු පොරාණට්කායි-
×මෙයින් මූලබීජය, ඛන්ධබීජය, ඵළුබීජය, අග්ගබීජය, බීජබීජයයි, යන පඤ්චප්‍රකාර බීජගාමය විකොපනය කරන්නාහට දුක්කටාපත්තියයි දතයුතු.

32 අජ්ඣොකාසෙතු මඤ්චාදිං කත්වා සන්ථරණාදිකං
සඞ්ඝිකං යාති පාචිත්ති අකත්වාපුච්ඡනාදිකං
33 සඞ්ඝිකාවසථෙ සෙය්‍යං කත්වා සන්ථරණාදිකං
අකත්වාපුච්ඡනාදිං යො යාති පාචිත්තියස්සපි
34 ජානං සප්පාණකං තොයං පාචිත්ති පරිභුඤ්ජයෙ*
අඤ්ඤාතිකා භික්ඛුනියා ඨපෙත්වා පාරිවට්ටකං
35 චීවරං දෙති පාචිත්ති චීවරං සිබ්බතෙ පිච
අනිරිත්තං අකාරෙත්වා පවාරෙත්වාන භුඤ්ජතො

---

32 සඞ්ඝිකං, සඟසතු; මඤ්චාදිං, ඇඳආදිය; (ආදිශබ්දයෙන් පුටු, බිසි, කොච්ඡයයි කියනලද වැහැරි ආදියෙන්කළ නිසීදන) අජ්ඣොකාසෙතු, අභ්‍යවකාශයෙහි වනාහි; සන්ථරණාදිකං, ඇතිරීම්ආදිය,[ආදිශබ්දයෙන් අනුන්ලවා ඇතිරවීම]කත්වා, කොට; ආපුච්ඡනාදිකං, පිළිවිසීම්ආදිය; (ආදිශබ්දයෙන් උඩරණ උඩරාපන) අකත්වා, නොකොට; යාති, (යම්භික්ෂුවක්තෙම බැහැරට)යේනම්; තස්ස, ඕහට; පාචිත්ති, පචිති (ඇවැත්) සියා, වෙයි-

33 යො, යම්භික්ෂුවක්තෙම; සඞ්ඝිකාවසථෙ, සඟසතු ආවාසයෙක්හි; සෙය්‍යං, සයනයක්; සන්ථරණාදිකං, ඇතිරීම්ආදිය; කත්වා, කොට; ආපුච්ඡනාදිං, පිළිවිසීම්ආදිය; (ආදිශබ්දයෙන් උඩරණ උඩරාපනය) අකත්වා, නොකොට; යාති(බැහැරට)යේනම්; තස්සපි, ඕහටද; පාචිත්ති, පචිති(ඇවැත්වෙයි)-

34 සප්පාණකං, ප්‍රාණීන්සහිතවූ; තොයං, ජලය; ජානං, දන්නේ; පරිභුඤ්ජයෙ, පරිභොග කෙරේනම්; පාචිත්ති, (ඕහට) පචිති (ඇවැත්වෙයි) පාරිවට්ටකං, පෙරළි හෙවත් මාරුකිරීමක්; ඨපෙත්වා, තබා; අඤ්ඤාතිකා භික්ඛුනියා, නොනෑ මෙහෙණින්නකට-මත්තට සම්බන්ධයි-

35 චීවරං, සිවුරක්; දෙති, දේනම්; පාචිත්ති,(ඒභික්ෂුහටද,) පචිති (ඇවැත්වෙ)යි; චීවරං,(නොනෑමෙහෙණින්නගේ)සිවුරක්; සිබ්බතොපිච, ගෙත්තම්කරණ භික්ෂුවටද;(පචිතිඇවැත්වෙයි;) පවාරෙත්වා,(ලඟටගෙණා භොජනය)ප්‍රතික්ෂෙපකොට; අනිරිත්තං අකාරෙත්වා; අතිරිත්ත නොකරවා; හෙවත් ඉතිරි නොකරවා; භුඤ්ජතො, අනුභව කරන්නාහටද; (පචිති ඇවැත්වෙයි-)

---

*පරිභුඤ්ජතො,යී ඇතම්පෙළපොත්වලසහ අභිනවටීකාවෙහි දපෙනේ-ඊටපරිභොග කළබැවින් නොහොත් පරිභොගයහෙතු කොටගෙණයයි අර්ථසැලකියයුතුබවද එමටීකාවෙහි දක්වනලදී·

36 භික්ඛුංආසාදනාපෙක්ඛො පවාරෙති පවාරිතං
නතිරිත්තෙන භුත්තෙන* පාචිත්තිය මුදීරිතං

37 සන්නිධිභොජනංභුඤ්ජෙ විකාලෙයාව කාලිකං
භුඤ්ජතොවාපි පාචිත්තිඅගිලානො පණීතකං

38 විඤ්ඤාපෙත්වානභුඤ්ජෙය්‍ය සප්පිතෙලාදි කප්පිච
අප්පටිග්ගහිතංභුඤ්ජෙ දන්තකඨොද කංවිනා

39 තිත්ථියස්සදදෙකිඤ්චි භුඤ්ජිතබ්බං සහත්ථතො
නිසජ්ජංවා රහොකප්පෙ මාතුගාමෙන චෙකතො

---

36 ආසාදනාපෙක්ඛො, චොදනාකරණු කැමැත්තේ; පවාරිතං, පවාරණයකළාවූ; භික්ඛුං, භික්ෂුවකට; නතිරිත්තෙන; අනධිකභොජනයකින්; පවාරෙති, පවරනම්; භුත්තෙතු,(බොජුන්)අනුභවකළකල්හි වනාහි; තස්ස, (අනතිරිත්තභොජනයෙන් පැවරීමකළ)ඒභික්ෂුවට;පාචිත්තියං,පචිති(ඇවැත්)උදීරිතං,කියනලදී.

37 සන්නිධිභොජනං, සන්නිධිභොජනයක්; † භුඤ්ජෙ, අනුභවකෙරේනම්;‡ පාචිත්ති, පචිති(ඇවැත්වෙ)යි; විකාලෙ, පෙරවරු ඉකුත්කල්හි; යාවකාලිකං, (වනමුල්ඵලාදි) ආමිස භොජනයක්; භුඤ්ජතොවාපි, අනුභවකරන්නාහටද;(පචිතිඇවැත්වෙයි)අගිලානො,නොගිලන්වූයේ;පණීතකං,ප්‍රණීතවූ-මත්තටසම්බන්ධයි

38 සප්පිභත්තාදිකම්පිච,ගිතෙල්මුසු බත්ආදියද; විඤ්ඤාපෙත්වාන, ඉල්ලාගෙණ; භුඤ්ජෙය්‍ය, අනුභවකෙරේනම්; (ඕහට පචිති ඇවැත්වෙයි) දන්තකඨොදකංවිනා, දැහැටිපැන්හැර; අප්පටිග්ගහිතං, නොපිළිගත්දෙයක්; භුඤ්ජෙ, අනුභවකෙරේනම්; (ඕහට පචිති ඇවැත් වෙයි-)

39 තිත්ථියස්ස, තීර්ථකයෙක්හට; සහත්ථතො, තමාඅතින්; කිඤ්චිභුඤ්ජිතබ්බං, කිසිඅනුභව් කළයුත්තක්; දදෙ, දේනම්; (ඕහට පචිති, ඇවැත්වේ) මාතුගාමෙනච, මාගමක්හාද; එකතො, එක්ව; රහො, ප්‍රතිච්ඡන්නයෙහි; නිසජ්ජංවාකප්පෙ, හිඳීමහෝකෙරේනම්; (ඕහට පචිති ඇවැත්වෙයි-)

---

*අනතිරිත්තෙන,යි ඇතම්පොතක තිබේ-එමඅර්ථයි-

†සන්නිධිභොජනයනම්, තුන්කාලිකයහැර තෙමේ පිළිගෙණ එක්රැයක් ඉකුත්කළයාවකාලිකයයිකියනලදපචවිධභොජනයයි

‡භුජෙ, යන්න නිමිත්තාර්ථයෙහි සප්තමීයයි අභිනවටීකාවෙහි දක්වන ලදී-

40 සුරාමෙරය පානෙපි පාචිත්තිය මුදීරිතං
අඞ්ගුලිපතොදකෙචාපි * හසධම්මෙ පිචොදකෙ
41 අනාදරෙපි පාචිත්ති භික්ඛුංභිංස යතොපිවා
භයානකං කථංකත්වා දස්සෙත්වාවා භයානකං
42 ඨපෙත්වා පච්චයංකිඤ්චි අගිලානො ජලෙය්‍යවා
ජොතිං ජලාපයෙය්‍යවා තස්සපාචිත්තියංසියා
43 කප්පබින්දුමනාදාය නවචීවර භොගිනො
භසාපෙක්ඛස්සපාචිත්ති භික්ඛුනො චීවරාදිකං

---

40 සුරාමෙරයපානෙපි, සුරාභාමෙරය පානය නිමිත්තකොට ගෙණද; අඞ්ගුලිපතොදකෙචාපි, (ඇඟිල්ලෙන් කිසිලිආදිය ඤටා නාය කිරීමයයි කියනලද)ගිරිතිකෑවීමේහිද; නොහොත් ගිරිතිකෑ වීම නිමිත්තකොටගෙණද; පාචිත්තියං, පචිති(ඇවැත්)උදීරිතං, කියන ලදී-

41 අනාදරෙපි,(ශික්ෂාපදයෙන් අවවාදකළ පුද්ගලයාට හෝ ධර්‍මයටහෝ) අනාදර කිරීමෙහිද; පාචිත්ති, පචිතිඇවැත්වෙයි; භයානකං,භයානකවූරූපයක්; දස්සෙත්වාවා,දක්වාහෝ; භික්ඛුං,භික්ෂුවක්හු; භිංසයතොපිවා,බියගන්වන්නාහාටද;පචිතිඇවැත්වෙයි

42 අගිලානො, නොගිලන්වූයේ; කිඤ්චිපච්චයං, (පහන්දැල්වීම්පාත්‍රපිසීම්ආදී) කිසිප්‍රත්‍යයක්; ඨපෙත්වා, තබා; ජොතිං, ගිනි; ජලෙය්‍යවා, (තෙම්) දල්වන්නේනම්හෝ; ජලාපයෙය්‍යවා, (අනුන්ලවා) දල්වවන්නේනම්හෝ; තස්ස, ඕහට; පාචිත්තියං සියා, පචිති(ඇවැත්)වෙයි-

43 කප්පබින්දුං, (මොණර ඇස්මඩල මකුණුපිටයන මොවුන් අතුරෙන් අන්‍යතරයක් ප්‍රමාණවූ)කප්බිඳුව; අනාදාය, නොගෙණ; නවචීවරභොගිනො,අලුත්සිවුරක් පරිභොගකරණ භික්ෂුවට, පාචිත්ති, පචිති (ඇවැත්වෙ)යි; භික්ඛුනො, භික්ෂුවක්හුගේ; චීවරාදිකං, සිවුරුආදී පරිෂ්කාරයක්;(ආදිශබ්දයෙන් සෑම ශ්‍රමණ පරිෂ්කාර)-මත්තට සම්බන්ධයි-

---

* මේගාථාවෙහි අටකුරුබැගින් යොදනාලද පළමුවෙනි දෙවෙනි හතරවෙනි පදයන් හෙතුකොටගෙණ අනුෂ්ටුප් ඡන්දසෙහි ලකුණු පේනනමුත් (අඞ්ගුලිපතොද කෙචාපි)යී නවකුරකින් යොදනලද තුන්වෙනිපදය හෙතුකොටගෙණඒඡන්දස්හෙදය පෙනෙනාබැවින් මේඅනුෂ්ටුප් ඡන්දස නොවෙයි 'නදිස්සතෙඡන්දසං ඡන්දං' යනාදියෙන් දක්වනලද සාමාන්‍යගාථානම්වූ වෘත්තියයිසලකම්-වෙනත් නොයෙක් තන්හි අටකුරුපාද නවකුරුපාද මිශ්‍රබන්ධනයෝ පෙනෙතත් ඒසියල්ලක්ම මෙසේ සාමාන්‍යයෙන් ලබන ගාථායනනාමය ඇත්තේයයි සිතමි.

44 අපනෙත්වා නිධෙන්තස්ස නිධාපෙන්තස්සවාපන
ජානංපාණං හනෙභික්ඛු තිරච්ඡානගතම්පිච

45 ඡාදෙතුකාමො ඡාදෙති දුට්ඨුල්ලං භික්ඛුනොපිච
ගාමන්තර ගතස්සාපි සංවිධායිත්ථියා සහ

46 භික්ඛුංපහරතොවාපි තලසත්තික මුග්ගිරෙ
චොදෙතිවා චොදපෙති ගරුනාමූලකෙනපි

47 කුක්කුච්චුප්පාදනෙවාපි භණ්ඩනත්ථායු පස්සුතිං
සොතුංභණ්ඩ නජාතානං යාතිපාචිත්තියංසියා

---

44 අපනෙත්වා, පහකොටගෙණ; නිධෙන්තස්ස,(තෙමේ) හවන්නාවූද; නිධාපෙන්තස්සවාපන,(අනුන්ලවා)සඟවවන්නා ද; භයාපෙක්ඛස්ස, (ශලෝකනක්‍රියාවෙන්) ක්‍රීඩාකැමතිවූ භික්ෂුව ට; (පචිතිඇවැත්වෙයි) ජානං, ප්‍රාණයකැයිදන්නේ; තිරච්ඡානග තම්පිච, තිරශ්චීනගතවූද; පාණං, ප්‍රාණයක්; හනෙ, නසානෙ (ඕහට පචිති ඇවැත් වෙයි)

45 භික්ඛුනො, භික්ෂුවක්හුගේ; දුට්ඨුල්ලම්පිච, සඞ්ඝාදිසෙස සාපත්තියක්ද; ඡාදෙතුකාමො, වසනුකැමතිවූයේ; ඡාදෙති, (ය ම්භික්ෂුවක්තෙම)සඟවානම්,(ඕහටපචිතිඇවැත්වෙයි)සංවිධාය,ම න්ත්‍රනයකොට;ඉත්ථියාසහ,(මිනිස්)මාගමක්හාඑක්ව;ගාමන්තරග තස්සාපි,හුන්ගමින්අන්ගමකටගියභික්ෂුවටද,(පචිතිඇවැත්වෙයි

46 භික්ඛුං,භික්ෂුවක්හට;පහරතොවාපි, ප්‍රහාරණය කරන්නා හටද; (පචිති ඇවැත්වේ) භික්ඛුං, භික්ෂුවක්හට; තලසත්තිකං,අ න්සත්; උග්ගිරෙ, නගානම්; (පචිතියි)අමූලකෙන(දෘෂ්ටශ්‍රැතාදී) මූල්නැත්තාවූ; ගරුනාපි, සඞ්ඝාදිසෙසාපත්තියකින්ද * චොදෙ තිවා, (භික්ෂුවක්හට තෙමේ) චොදනා කෙරේනම්හෝ; චොද පෙතිවා, (අනුන්ලවා) චොදනා කරවානම් හෝ; (ඕහටපචිති ඇවැත්වෙයි-)

47 කුක්කුච්චුප්පාදනෙවාපි, (අනුපසම්පන්නොනාත්වං මඤ්ඤෙ) යනාදිවචනයෙන් කුකුසක් ඉපදවීමෙහිද; (පචිති ඇවැත් වෙයි) භණ්ඩනත්ථාය, කලහපිණිස; භණ්ඩනජාතානං, උපන්ඩබර ඇත්තවුන්ගේ; සොතුං, (වචන) අසන්නට; උපස්සුතිං, බස්ඇසෙන තැනට; යාති,යේනම්;පාචිත්තියංසියා,(ඕහට)පචිතිඇවැත්වෙයි-

---

* ගරුශබ්දය සාමාන්‍යවචනවූයේද ප්‍රකරණහෙයින් මෙහි සඞ්ඝාදිසෙසයම අභිමතයි-

48 සඞ්ඝස්සලාභං පරිනාමිතන්තු
නාමෙතියොතං පරපුග්ගලස්ස
පුච්ඡං අකත්වාපිච සන්තභික්ඛුං
පාචිත්ති ගාමස්සගතෙ විකාලෙ
පාචිත්තිය නිද්දෙසො.

49 සඞ්ඝිකං ගරුකංභණ්ඩං යොදෙතඤ්ඤස්සඉස්සරෝ
ථුල්ලච්චයං යථාවත්ථුථෙය්‍යා පාරාජිකාදිපි

48 යො, යම්භික්ෂුවක්තෙම; සඞ්ඝස්ස, සඞ්ඝයාට; පරිනාමිතං, පිරිනමනලද; යංලාභං, යම්(චීවරාදි)ලාභයක්ඇද්ද, තංතු,ඒ ලාභයවනාහි; පරපුග්ගලස්ස, අන්‍යපුද්ගලයෙකුට; නාමෙති, පිරිනැමුම්කරවානම්; (ඕහටද පචිතිවේ) සන්තභික්ඛුං, විද්‍යමාන භික්ෂුව; පුච්ඡංඅකත්වා, විචාරීම නොකොට; විකාලෙ, විකාලයෙහි; ගාමස්ස, ගමට;* ගතෙඅපිච, ගියභික්ෂුවටද;† පාචිත්ති, පචිති ඇවැත්වේ-පාචිත්තියනිද්දෙසො,පචිතිනිර්දේශය(නිමියේ)යි (දැන් ප්‍රකීර්ණකය දක්වනුපිණිස 'සඞ්ඝිකං' යනාදිය ආරබ්ධයි)

49 යො, යම්භික්ෂුවක්තෙම: ඉස්සරො,ඉසුරුවූයේ; සඞ්ඝිකං, සඞ්ඝසන්තකවූ; ගරුකංභණ්ඩං, ගරුබඩු;‡ අඤ්ඤස්ස, අනිකෙකුට; දෙති, දේනම්; ථුල්ලච්චයං, (ඕහට)තුලසිනම් ඇවැතෙක්වේ ථෙය්‍යා, සොරසිතින්; අනිකෙකුට දේනම්; යථාවත්ථු, වස්තුවූ පරිද්දෙන්; හෙවත්බඩුඅගනාසෙයින්; පාරාජිකාදිපි පරිජිආදිදවෙයි-

*ගාමස්ස, යනුකර්මාර්ථයෙහි සාමිවචනයි-

†ගතෙ, යනුසම්ප්‍රදානාර්ථයෙහි භුම්මවචනයි-

‡ගරුබඩුනම්, සංක්ෂෙපයෙන්; ආරාමාදිය,විහාරාදිය,මඤ්චපීඨාදිය, ලොහකුම්භාදිය, වල්ලිකාදිය, යනමොවුන්ගේ වසයෙන් පඤ්චප්‍රකාරයෙකි. එහි'ආරාමාදිය'ආරාමය ආරාමවස්තුවයයි දෙකොටසෙකි; 'විහාරාදිය' විහාරය විහාරවස්තුවයයි දෙකොටසෙකි: 'මඤ්චපීඨාදිය' ඇඳය, පුටුය, බිසිය, බිම්බෝහණයයි සතර කොටසෙකි; ලොහකුම්භාදිය,ලොහකුම්භිහෙවත් ලොහොසැලිය ලොහකටාහය, ලොහභාණකහෙවත් ලොහොම්භසැලිය; වාරක හෙවත් කලය, කෙටේරිය, වෑය, පොරව,උදැල්ල, නියනයයි නවකොටසෙකි, 'වල්ලිකාදිය' වැල්ය, උනය තෘනභාපත්‍රය මුදුනනය, බබුස්තනය, ප්‍රකෘතිමැටිය, ඇවය, මැටි භාණ්ඩයෝයයි අටකොටසෙකි, මෙසේ විස්තාරයෙන් ගරුබඩු පස්විස්සෙකැයි, දතයුතු-එහෙයින්-

''ද්විසඞ්ගාහානි ද්වෙහොන්ති තතියං චතුසඞ්ගාහං,
චතුත්ථංනවකොට්ඨාසං පඤ්චමං අට්ඨභෙදනං.
ඉතිපඤ්චහිරාසීහි පඤ්චනිම්මලලොචනො
පඤ්චවීසවිධංනාථො ගරුභණ්ඩංපකාසයීති'' කීයනලදී-

50 කුසාදිමයචීරානි කම්බලං කෙසවාලජං
සමයං විනාධාරයතො ලූකපක්ඛාජිනක්ඛිපං
51 සත්ථකම්මෙ වත්ථිකම්මෙ සනාමිත්තකඤ්ච ජිඝතො
ථුල්ලච්චයං මනුස්සානං මංසාදිභොජනෙපිවා
52 කදලෙරකක්කදුස්සානි පොත්ථකං සබ්බනීලකං
සබ්බපීතාදිකඤ්චාපි ධාරයන්තස්සදුක්කටං

---

50 කුසාදිමය චීරානි, කුසතෘණාදියෙන් කළවැහැරිදු;[ආදිශබ්දයෙන්; වාක, හෙවත් වල්කල,ඵලක හෙවත්පුවරු චීවරයන්ද) කෙසවාලජං, කෙසයෙන්හා වාලයෙන්කළාවූ; කම්බලං, පලසුදු; උලූකපක්ඛ, මහමුහුණු පියාපත්හා; අජිනක්ඛිපං, අඳුන්දිවි සමුදු; සමයංවිනා, (නෂ්ටචීවර) කාලයතබා; ධාරයතො, දරන්නාහට; (යටින්ථුල්ලච්චයං, යනුවැටෙනහෙයින්;) ථුල්ලච්චයං, තුලසිවේ-

51 සත්ථකම්මෙ, ශස්ත්‍රයෙන් (පැළීම් ආදිකළයුතු කර්මයෙහිද; වත්ථිකම්මෙ,වස්තියෙහි(කළයුතු)කර්මයෙහිද;‘තුලසිසි’සනාමිත්තනං. නමානිමිති; ජිඝතොච, සිඳින්නාහටද; (තුලසිසි) * මනුස්සානං, මිනිසුන්ගේ;මංසාදී, මස්ආදිය;(ආදිශබ්දයෙන්, ඇට,ලේ, සම්,ලොම්,)භොජනෙපිවා,අනුභවකිරීමෙහිද; ථුල්ලච්චයං,තුලසි(වෙ)යි†-

52 කදලිඑරක අක්කදුස්සානි, කෙහෙල්, එරුපත්, වරාදුලෙන් කළපිලිද; පොත්ථකං, මකච්දුලෙන්කළ පිලීද; සබ්බනීලකං, සර්වනිල්පිලිද; සබ්බපීතාදිකඤ්චාපි, සර්වරන්වන් පිලිආදියද; (ආදිශබ්දයෙන්; සර්වලොහිතක, සර්වකෘෂ්ණක, සර්වමාඤ්ජෙෂ්ඨිකාපිලි) ධාරයන්තස්ස, දරන්නාහට; දුක්කටං, දුකුළා(වෙ)යි-‡

---

* කිසිරොගයකින් පෙළෙනලද්දෙක්ව සින්දේනම් අනාපත්තියි-

† ථුල්ලච්චයං, යන්න ගැණ- ) ථුල්ලච්චයන්තියං වුත්තන්තං සුණොහි යථාතථං
එකස්සමූලෙ දෙසෙති යොචතං පටිගණ්හති
අච්චයොතෙනසමොනත්ථිතෙනතංඉතිවුච්චතීති’යි

කියනලදී-මෙහි අදහස, තුලසියයි, යමක්කියන ලද්දේද; එයතත්වූ පරිද්දෙන් අසව; එක්කෙනෙක්හුගේ සමීපයෙහි දෙසයිද; යමෙක් එයපිළිගණීද, මෙසේවූ අපරාධයන් අතුරෙන් ඒහා සමාන අපරාධයෙක් නැද්ද, එහෙයින් ඒතෙමේ මෙසේ ථුල්ලච්චය යනනමින්කියනු ලැබේ-යනුයි-

‡ “දුක්‍ර්‍වජිතං, ගරහිතබ්බංකටං දුක්කටං”දුයයිසේයි, කුත්සිතාය ගර්හිණීයකෙළෙදුස්කෘතයි, දුක්ඛන අකරයීතිදුක්කටං, දුකින් කරණ ලද්දේනුයි දුස්කෘතයි, යන්නෙන් දුක්කටං, යන්න තේරුම් කරණලදී-

53 හත්ථිස්සුරග සොණානං සීහබ්‍යග්ඝච්ඡ දීපිනං
තරච්ඡස්සච මංසාදිං උද්දිස්ස කතකම්පිච

54 අනාපුච්ඡිත මංසඤ්ච භුඤ්ජතො දුක්කටංසියා
යථානුපුබ්බං හිත්වා නදක තිණාදිකං වජෙ

55 සහසාවුබ්භජිත්වාන පවිසෙ නික්ඛමෙය්‍යවා
වච්චපස්සාව කුටිකංවිනා උක්කාසිතං විසෙ*

56 නිත්ථුනන්තො කරෙවච්චං දන්තකට්ඨඤ්ච ඛාදයං
වච්චපස්සාව දෙණීනං බහිවච්චාදි කංකරෙ

---

53 හත්ථිඅස්සඋරගසොණානං, හස්තිය; අශ්වය, දීඝිජාතිය, සුණඛය; යනමොවුන්ගේද, සීහබ්‍යග්ඝ අච්ඡදීපිනං, සිංහය, ව්‍යාඝ්‍රය, වලස්ය, දිවිය, යනමොවුන්ගේද; තරච්ඡස්සච, කරබානා වලස්හුගේද; මංසාදිං, මාංසාදියද;(ආදිශබ්දයෙන් මෙතෙක්දෙනාගේ ඇටදු, සමුදු, ලොමුදු,) උද්දිස්ස, හිඟුළදෙසා; කතකම්පිච, මැරූමාංසද;†-මත්තට සම්බන්ධයි-

54 අනාපුච්ඡිත මංසච, නොවිචාරණලද මාංසයද; භුඤ්ජතො, වළඳන්නාහට; දුක්කටංසියා, දුකුළාවෙයි; යථානුපුබ්බං, යනාවුන්ගේ අනුක්‍රමය; හිත්වාන, හැර; දකතිණාදිකං, නාගනතොටඅදියට; ( ආදිශබ්දයෙන් වච්චපස්සාව කුටිවලට ) වජෙ, යේනම්; (දුකුළාවේ-)

55 සහසා, වෙගයෙන්; වුබ්භජිත්වාන, (අඳනය දුරදීම) නගා වච්චපස්සාව කුටිකං, වැසිකිලිහා කෙසකිලියට; පවිසෙවා, වදිනම්හෝ; නික්ඛමෙය්‍යවා, (එයින්) නික්මේනම්හෝ (දුකුළාපි)උක්කාසිතං,කැරීම; විනා,හැර,විසෙ,(එයට)ප්‍රවිෂ්ටවේනම්(දුකුළාවේ)

56 නිත්ථුනනොනාව, තතනමින්ද; දන්තකඪං, දැහැටි; ඛාදයඤ්ච, කමින්ද; වච්චංකරෙ, වර්චස්කෙරේනම්; වච්චපස්සාවදොණීනං, මලමුත්‍ර ආවාටයන්ගේ; බහි, පිටත; වච්චාදිකං, මලමුත්‍ර; කරෙ, කෙරේනම්; (දුකුළාවේ-)

---

*දුකුච්ඡිතං ගරහිතබ්බංකටං දුක්කටං’ දුයසිජෙසි කුජ්ශිතයග හීණියකෙලේ දුශ්කෘතයි, දුක්ඛෙන අකරීයීති දුක්කටං, දුකින් කරණලද්දේනුයි දුශ්කෘතයි, යන්නෙන් දුක්කටං, යන්නතේරුම් කරණලදී-

† මෙහි වනාහි උපලක්ෂණ වසයෙන්හෝ පිචශබ්දයෙන්හෝ මාංසග්‍රහණයෙන් මත්ස්‍යාදීන්ගේද ගැන්මදතයුතු-

57 ඛරෙනවා වලෙඛෙය්‍ය කණ්ඨපාතෙය්‍ය කූපකෙ
උගඝතඤ්ච නධොවෙය්‍ය උක්ලාපඤ්ච නසොධයෙ
58 දකකිච්චං කරොන්තස්ස කත්වාචපුච පූතිච
අනජ්ඣිට්ඨොව ථෙරෙණ පාතිමොක්ඛම්පි උද්දිසෙ
59 අනාපුච්ඡාය පඤ්හස්ස කථනෙ විස්සජ්ජනෙපිච*
සජ්ඣායකරණෙදීප ජාලනෙ විජ්ඣාපනෙපිච†
60 වාතපානක වාටානි විවරෙ... ථකෙය්‍යවා
වන්දනාදිං කරෙනගෙහා ගමනං භොජනාදිකං
61 පරිකම්මං කරෙකාරෙති පටිච්ඡන්නකංවිනා.
කායං නහායං සංසෙය්‍ය කුඩ්ඩථම්භෙන රුම්හිවා

---

57 ඛරෙනච, කොරොස් පුසාකින්ද; අවලෙඛෙය්‍ය, පුසන්නි... කෙරේනම්; කූපකෙ, වැසිකිළිවලෙහි; කණ්ඨපාතෙය්‍ය, පුසන්... නම්; උගඝතඤ්ච, තැරවූඅඤ්ඤමිලද; නධොවෙය්‍ය, නොහරිනම්... උක්ලාපඤ්ච, කසලද; නසොධයෙ, නොඇමදීනම්; (දුකුලාවේ...

58 චපුචපූඉති, චපුචපූයන අනුකරණහඬ; කත්වා, කොට; දක... කිච්චංකරොන්තස්සච, ජලකෘත්‍යය කරන්නාහටද; (දුකුලාවේ... ථෙරෙණ, සංඝස්ථ විරහුවිසින්; අනජ්ඣිට්ඨොඑව, නොඅ...ණවන... ලද්දේම, පාතිමොක්ඛම්පි, ප්‍රාතිමොක්ෂයද; උද්දිසෙ, උදෙස... නම් (දුකුලාවේ-)

59 අනාපුච්ඡාය, (මහල්ලන්) නොපිළිවිස; පඤ්හස්සකථනෙ, පැණපිළිවිසීමෙහිද, විස්සජ්ජනෙපිච, විසදීමෙහිද; සජ්ඣායකරණෙ, හැදෑරුම්කිරීමෙහිද; දීපජාලනෙ, පහන්දැල්වීමෙහිද; විජ්ඣාපනෙපිච, (පහන්) නිවීමෙහිද, (දුකුලාවේ-)

60 (අනාපුච්ඡාය, යනු යටින්වැටේ) අනා පුච්ඡාය, (මහල්ලන්) නොපිළිවිස; වාතපානක වාටානි, ආලොකසන්ධි එළකඟා මාරඑ ළකයන්; විවරෙය්‍යවා, හරිනම්හෝ; ථකෙය්‍යවා, පියාලානම්හෝ (දුකුලාවේ); නගෙහා, නග්නවූයේ; වන්දනාදිං, වැඳුම්ආදියද; (ආදිශබ්දයෙන් වැඳුම් ගැණීම;) ගමනං, ගමන්ද; භොජනාදිකං, ආහාර වැළඳීම්ආදියද; (ආදිශබ්දයෙන් පීම, කෑම, ගැන්ම, දීම;) කරෙ, කෙරේනම්; (දුකුලාවේ).

61 තිපටිච්ඡන්නකංවිනා, (ජන්තාඝර පටිච්ඡාදිය, උදක පටිච්ඡාදිය, වස්ත්‍ර පටිච්ඡාදිය,යන) තුන් ප්‍රතිච්ඡන්නය හැර; පරිකම්මං, පිරියම්; කරෙ, (තෙමේ) කෙරේනම්; කාරෙ, (අනුන්ලවා) කරවා නම්; (දුකුලාවේ,) නහායං, ස්නානය කරන්නේ; කුඩ්ඩෙවා, භිත්තියෙහිහෝ; ථම්භෙවා, ටැම්හිහෝ; තරුම්හිවා, රුක්හිහෝ; කායං, ශරීරය; සංසෙය්‍ය, ඝසානම්; (දුකුලාවේ)

---

* සමහර පොතක 'විස්සජ්ජනෙපිච'යිද පාඨයි.

† මේතැණ 40 ගාථාවේ නෝට්එක බලනු.

62 කුරුවින්දක සුතෙතන අඤ්ඤමඤ්ඤඤ්ච කායතො
අගිලානො බහාරාමෙ වරෙය්‍යස උපාහනො
63 උපාහනං යොධාරෙති සබ්බනීලාදි කම්පිච
නිමිත්තං ඉත්‍ථියාරතෙතා මුඛංවා භික්ඛදුසියා
64 උජ්ඣානසඤ්ඤී අඤ්ඤස්සපත්තංවා අත්තනොමුඛං
ආදාසාදිමහි පස්සෙය්‍ය උච්චාසන මහාසනෙ
65 නිසජ්ජාදිං කරොන්තස්ස දුක්කටං වන්දනෙපිච
උක්ඛිත්තානුපසම්පන්නාන නානාසංවාස කාදීනං

62 කුරුවින්දක සුත්තෙන, කුරුඳුවැලෙන්; (කායං, යනුද; ඝංසෙය්‍ය, යනුද වැටෙන බැවින්)කයගහානම් (දුකුළාවේ) අඤ්ඤමඤ්ඤඤ්ච, අනොන්‍යාන්‍යයාද; කායතො, ශරීරයෙන්; ගහාඋලානම්, දුකුළාවේ; අගිලානො, නොගිලන්වූ; සඋපාහනො, වහන් සහිත තැනැත්තේ; බහාරාමෙ, ආරමයෙන් බැහැර; වරෙය්‍යයේනම්, (දුකුළාවේ-)

63 යො, යම්භික්ෂුවක්තෙම; සබ්බනීලාදිකම්පිච, සර්වනීලාදිවූද (ආදිශබ්දයෙන්; සර්වලොහිත ඔදාත, පීත, කෘෂ්ණ, මාඤ්ජෙෂ්ඨ මහාරඞ්ග, මහානාම රඞ්ගරත්තාදිවූද;) උපාහනංධාරෙති, වහන්ලාද; ඕහට (දුකුළාවේ) රත්තො, රාගසිත් ඇත්තේ; ඉත්‍ථියා (එදවස් උපන්නාවූද මිනිස් අමිනිස් තිරිසන් මාගමකගේ; නිමිත්තංවා, නිමිත්තහෝ; භික්ඛදුසියා, භික්ෂුව දෙන්නියගේ; මුඛංවා, මුහුණහෝ;-මතුසම්බන්ධයි-

64 උජ්ඣානසඤ්ඤී, අවමන්සංඥාඇතිවූයේ; අඤ්ඤස්ස,අන්භික්ෂුවකගේ; පත්තංවා, වලඳන පාත්‍රයහෝ; ආදාසාදිම්හි, කැවපත්ආදියෙහි; (ආදිශබ්දයෙන් පැන්පායාදියයි, නොහොත් යම්යම්තැන මුඛනිමිත්ත පැණේද ඒඒ තන්හි) අත්තනොමුඛංවා, තමාංමුහුණහෝ; පස්සෙය්‍යබලානම්, (දුකුළාවේ)*උච්චාසන මහාසනෙ උසහුන් මහඅස්නෙහි†-මතුසම්බන්ධයි-

65 නිසජ්ජාදිං, හිඳීම්ආදිය; කරොන්තස්ස, කරණ භික්ෂුවහට, දුක්කටං, (දුකුළාවේ) උක්ඛිත්ත, උක්ඛිත්තකයාද; අනුපසම්පන්නා අනුපසම්පන්නයාද; නානාසංවාසක, නානා සංවාසකයාද; යන, ආදිනං, ආදීන්ට; (ආදිශබ්දයෙන්, ජිනනමූලක හෙවත් අන්තිම වස්තුවට පැමිණියාටද;) වන්දනෙපිච, වැඳිමෙහිද; (දුකුළාවේ-)

* මාපැහැය සිව් සහිතද්‍යෙහෝ නොවේද්‍යෙහෝ ජීර්ණද්‍යෙහෝ නොවේද්‍යෙහෝයි බලන්නට වටී-

† මෙහි ප්‍රධානවසයෙන් 'උච්චාසන මහාසනෙ'යි කියනලදී පුටුආදිහුද මෙහිම සඞ්ග්‍රහවනු ලැබෙත්-

66 එකතො පණ්ඩකිත්ථීහි උභතොබ්‍යඤ්ජනෙනවා
දීඝාසනෙ නිසීදෙය්‍ය අදීඝෙ ආසනෙපන

67 අසමානාසනිකෙනාපි මඤ්චපීඨෙ සයෙය්‍යවා
තූලසඞ්ගහණං දදතො එලපුප්ඵාදි කම්පිච

68 ගන්ථිමාදිං කරෙකාරෙ ජිනවාරිත පච්චයෙ
පරිභුඤ්ජෙය්‍ය අබ්‍යත්තො අනිස්සාය වසෙය්‍යවා,

69 අනුඤ්ඤාතෙහි අඤ්ඤස්ස භෙසජ්ජංවා කරෙවදෙ
කරෙසාපත්තිකොභික්ඛු උපොසථපවාරණං

---

66 දීඝාසනෙ, දික්අස්නෙහි*; පණ්ඩකිත්ථීහිවා, පණ්ඩකයා; ස්ත්‍රී යයනමොවුන්හාද; උභතො බ්‍යඤ්ජනෙනවා, උභතො බ්‍යඤ්ජනයාහාද; එකතො,එක්ව;නිසීදෙය්‍ය,(යමෙක්)හිඳිනම්;(ඕහටදුකුළාවේ)අදීඝෙආසනෙපන, නොදික්අස්නවූ වනාහි-මතුසම්බන්ධයි-

67 මඤ්චපීඨෙ, ඇඳපුටුවෙහි; අසමානාසනි කෙනාපි, අසමානාසනිකයාහාද; සයෙය්‍යවා, හොවීනම්; (වා ශබ්දය අවුත්ත සමුච්චය හෙයින්; හිඳිනම්) (දුකුළාවේ) එලපුප්ඵාදිකම්පිච, ගෙඩිමල් ආදී යද; තූල සඞ්ගහණං, තූල සඞ්ග්‍රහය පිණිස; දදතො; දෙන තැනැත්තාහට, (දුකුළාවේ.)

68 ගන්ථිමාදිං, ගන්ථිමයනාදි පුෂ්පවිකෘතිය:† කරෙ,(තෙමේ) කෙරේනම්; කාරෙ,(අනුන්ලවා) කරවානම්; ජිනවාරිත පච්චයෙ බුදුන් විසින් වැළැක්වූ ප්‍රත්‍යයන්; ‡ පරිභුඤ්ජෙය්‍ය, වලඳනම් (දුකුළාවේ) අබ්‍යත්තො, නොවියත්වූයේ; අනිස්සාය, (ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්) නොනිසාද්‍යෙහෝ නොහොත්; නිසනොගෙණ, වසෙය්‍යවා, වෙසේනම්හෝ; (දුකුළාවේ-)

69 අනුඤ්ඤාතෙහි, අනුදත්තවුන් කෙරෙන්; අඤ්ඤස්ස, අනිකෙකුට; භෙසජ්ජං, පිළියම්කරෙවා; කෙරේනම්හෝ වදෙවා,කියානම්හෝ; (දුකුළාවේ)§ සාපත්තිකො, ආපත්තිසහිතවූ; භික්ඛු, භික්ෂුතෙම; උපොසථපවාරණං, පොහොපවුරුණු; කරෙ, කෙරේනම් (දුකුළාවේ×-)

---

*යටත්පිරිසෙයින් තුන්දෙනෙකුන්ට හිඳිනට පොහොණේ දික් අස්න නමි-

†ගන්ථෙනෙන නිබ්බත්තං දාමංගන්ථිමං, යනු විනයාලඞ්කාර ටීකායි, ගෙතීමෙන් උපන් (මල්දම) ගන්ථිම නම්යනුයි-

‡ගේකුලදූසක කර්‍මයවූ වෙදකම් දූතකම් ආදියෙන් ලදපසයයි-

§පස්සැහැ දැමියන්ටද, මව්පියන්ටද, ඔවුන්ට උපස්ථාන කරන්නවුන්ටද, භික්ෂුනිශ්‍රිතවූ පණ්ඩුපලාසකයාහා සඞ්ඝයාගේ මෙහෙකිරීමෙහිනියුක්තවූ කප්පියකාරකයාටද මහපියසුළුපිය මහබෑසුළුබෑ මහනැගනි සුළුනැගනි ආදීන්ටද, පිළියම්කරන්නට අනුදත්තාහ, ඔවුන්කෙරෙන් සෙස්සන්ට පිළියම්කරන්නට නොලැබේ-

×මෙහි පොහොපවුරුණු නිදසුන් මාත්‍රයක, සියළුම සඞ්ඝකර්‍ම සාපත්තිකව කරන්නාහට දුකුළාවේ-

70 වාරබන්ධාදිකෙඨානෙ පරිවත්තක චාටකං
අපිධාය විනාභොගං නියොගංවාසයෙදිවා
71 ධඤ්ඤිත්ථිරූපරතනං ආවුධිත්ථිපසාධනං
තුරියභණ්ඩංඵලං රුක්ඛෙ පුබ්බණ්ණාදිඤ්ච ආමසෙ
72 සසිත්ථොදකතෙලෙහි ඵණහත්ථ ඵණෙහිවා
කෙසමොසණ්හණෙකසම්ං භාජනෙභුඤ්ජනෙපිච
73 එකත්ථරණ පාපුරණා*සයෙය්‍යුං වෙකමඤ්චකෙ
දන්තකඨඤ්ච ඛාදෙය්‍ය අධිකූනං පමාණතො,

---

70 ආභොගංවා, (මෙතෙම දොරප්‍රතිජග්ගණය කරන්නේයයි යන) සැලකීමහෝ; නියොගංවා, නියොගයහෝ; විනා,හැර, වාරබන්ධාදිකෙ, වාරබන්ධාදියඇති; ඨානෙ, සෙනස්නෙහි; පරිවත්තකවාටකං, පිරිවැටෙනදොර; අපිධාය, නොපියා; දිවා, දවහල්, සයෙ, සයනයකොරේනම්; (දුකුළාවේ-)

71 ධඤ්ඤ, සප්තවිධ ධාන්‍යයද;† ඉත්ථිරූප, (දැරුලොහාදිමයවූ ස්ත්‍රීරූපද; රතනං (දසවිධ) රත්නද;‡ ආවුධ, (අඩයටි තෝමරාදි සැම) ආවුදබඩුද; ඉත්ථිපසාධනං, ස්ත්‍රීපළඳනාද; තුරියභණ්ඩං, තූර්‍යබඩුද; රුක්ඛෙ, වෘක්ෂයෙහි; ඵලං, ගෙඩිද; අපුබ්බණ්ණාදිච, මුග්ගමාසාදි අපරණ්ණයද; ආමසෙ, පිරිමදීනම්; (දුකුළාවේ-)

72 සසිත්ථොදකතෙලෙහි, මීඉටිහාදිය සහිතතෙලින් නොහොත් ඉටිමුසු තෙලින්ද: දියමුසු තෙලින්ද ඵණහත්ථ ඵණෙහිවා, දන්තමයාදි පනාවෙන්හෝ; පනාකෘත්‍යය සාදන හස්තාඞ්ගුලි සඞ්ඛ්‍යාත අත් පනාවෙන් හෝ; කෙසං, කෙස්; ඔසණ්හෙණ මට කිරීමෙහිද; එකස්මිංභාජනෙ, එක්භාජනයෙක්හි; භුඤ්ජනෙපිච, (අනිකෙකුහා එක්ව) වැලඳීමෙහිද; (දුකුළාවේ-)

73 වෙ; භික්ෂූහුදෙදෙනෙක්; එකත්ථරණ පාපුරණා, එක්ඇතිරිලි ඇත්තාහූද; එක්පෙරවුම් ඇත්තාහූද; සයෙය්‍යුං, හොවිත් නම්; එකමඤ්චකෙ, එකඇඳෙහි හොවිත්නම්; පමාණතො, ප්‍රමාණයෙන්; අධිකූනං, වැඩිඅඩුවූ;§ දන්තකඨඤ්ච, දැහැටිද; ඛාදෙය්‍ය, කානම්; (දුක්කටාපත්තිවේ-)

---

* බුරුමරටේ පොත්වල පාවුරණා කියාතිබෙන නමුත් ලඞ්කාවේ පොත්වල (පාපුරණා)යී තිබේ-

†සාලිවීහි,වොකඞ්ගුකුද්‍රූසවරකගොධුමා, යනුහෙයින් හැල්ය සෙසුවීහෝ, මහවීය, යවය, තනය, හමුය, වරාය, තිරිඟුය, යන මොහු සප්තවිධ ධාන්‍යයෝයි-

‡ මුත්තාමණිවෙළුරියංච සංඛංසිලාපවාලං රජතං සුවණ්ණං
මසාරගල්ලම්පිච ලොහිතඞ්කං දසප්පකාරං රතනංවදන්ති,

යනුහෙයින් මුතුය, මැණික්ය, වෛදූර්‍ය්‍යය, හක්ය, ගල්ය,පබළුය, රිදීය, රත්රන්ය, මැසිරිගල්ය, ලොහිතඞ්කනම් මැණික්ය, යනු දසප්‍රකාර රත්නයයි කියත් යනුයි-

§ එහි පමණනම්, මිනිස්අඟුලෙන් සතරඟුල පටන් අටඟුලයි අධිකූනනම් අටඟුලකින් අධිකහා සතරඟුලකින් ඌනයයි-

74 යොජෙතිවා යොජාපෙතිනච්චං ගීතඤ්ච වාදිතං
දස්සනං සවනං තෙසං කරොන්තස්සච දුක්කටං
75 විහාදිරෙ පිමෙචාපි බහිපාකාර කුඩ්ඩකෙ
වච්චාදිඡඩ්ඩනාදිම්හි දීඝකෙසාදි ධාරණෙ,
76 නඛමට්ඨකරණාදිම්හි සම්බාධෙ ලොමහාරණෙ
පරිකම්මකතං භූමිං අක්කාමෙස උපාහනො
77 අධොත අල්ලපාදෙහි සඞ්ඝිකං මඤ්චපීඨකං
පරිකම්මකතං භිත්තිං ආමසන්තස්ස දුක්කටං
78 සඞ්ඝාටියාපි පල්ලත්ථෙ දුප්පභුඤ්ජෙය්‍ය චීවරං*
අකායබන්ධනොගාමං වජෙකත්වා නවච්චකං,

---

74 නච්චඤ්ච, නැටීමද; ගීතඤ්ච, ගායනාවද; වාදිතඤ්ච, වාදනයද; යොජෙතිවා, (තෙමේහෝ) යොදයිද; යොජාපෙතිවා (අනුන්ලවාහෝ) යොදවයිද; (ඕහට දුකුළාවේ) තෙසං, ඒනෘත්‍ය ගීතවාදුයන්ගේ; දස්සනඤ්ච, බැලීමද; සවනඤ්ච, ඇසීමද; කරොන්තස්ස, කරන්නාහට; දුක්කටං, දුකුළාවේ-

75 විහාදිරෙපිමෙචාපි, වීආදිය රොපනය කළතැන්හිද;† බහිපාකාරකුඩ්ඩකෙ, පවුරුභිත්තීන් බැහැරද; වච්චාදි ඡඩ්ඩනාදිම්හි, මලමුත්‍රාදීන්දැම්ම් ආදියෙහි (ආදිශබ්දයෙන් දැම්මවීමෙහි) (දුකුළායි)දීඝකෙසාදි, දික්කෙස් ආදිය; (ආදිශබ්දයෙන් නියනැගෑලොම්ද;) ධාරණෙ, දැරීමෙහි; (දුකුළාවේ-)

76 නඛමට්ඨකරණාදිම්හි, නියමටකෙරීම් ආදියෙහිද; (ආදිශබ්දයෙන් මට්ටම්කරවීමහා රජන් කිරීමෙහිද) සම්බාධෙ, දෙකිසිළිහා මුත්‍රකරණ ස්ථානයෙහි; ලොමහාරණෙ, රොම ඉදිරීමෙහිද; (දුකුළාවේ) සඋපාහනො, වහන් සහිතවූයේ; පරිකම්මකතං, පිරියම්කළ; භූමිං, බිම; අක්කමෙ, ඇක්මේනම්; (දුකුළාවේ-)

77 අධොත අල්ල, නොසෝදන ලද්දුවූද තෙත්වූද; පාදෙහි, පසින්; සඞ්ඝිකං, සඟසතු; මඤ්චපීඨකං, හැඳපුටු; අක්කමෙ, ඇක්මේනම්; (දුකුළායි)පරිකම්මකතං, පිරියම්කළ; භිත්තිං, භිත්තිය; ආමසන්තස්ස,අතින්ආමශීනයකරන්නාහට;දුක්කටං,දුකුළාවෙයි-

78 සංඝාටියා, ඉටුසඟලසිවුරෙන්; පල්ලත්ථෙපි, පල්ලත්තකිරීමෙහිද; (දුකුළායි) චීවරං, (තුන්සිවුරෙන් එක්තරා) සිවුරක්; දුප්පභුඤ්ජෙය්‍ය, දුප්පරිභොග කෙරේනම්; (දුකුළායි) අකායබන්ධනො කහබඟන් නැත්තේ; ගාමංවජෙ, ගම්වදිනම්;(දුකුළායි) වච්චකං කත්වාන, වර්චස් (කෘත්‍යය)කොට;-මතුසම්බන්ධයි-

---

* 'දුප්පරිභුඤ්ජෙය්‍ය'සී සමහර-

† 'විහාදිරෙපිමෙ' යනු තිදශීන මාත්‍රයක, පොල්, අඹ, කොස් ආදීන්රොපනයවූ තන්හිද මෙසේම දතයුතු-

79 නාවමෙය්‍යුදකෙසන්‍තෙ සමාදෙය්‍ය අකප්පියෙ
දෙසනාරොචනාදිම්හි සභාගාපත්තියාපිච
80 නවසෙවස්සංවිසංවාදෙ සුද්ධචිත්තෙ පටිස්සවං
වස්සංවසිත්වාගමනෙ අනනුඤ්ඤාත කිච්චතො
81 විනාපදංතරුස්සුද්ධං පොරිසම්හාභිරූහණෙ
අපරිස්සාවනොද්ධානං වජෙ තංයාචතොනදෙ
82 අත්තනො ඝාතනෙඉත්ථිරූපාදිං කාරයෙය්‍යවා
හිත්වාමාලාදිකං චිත්තං ජාතකාදිං සයංකරෙ

79 උදකෙසන්තෙ, දියඇතිකල්හි; නාඅාවමෙය්‍ය, ජලකෘත්‍ය නොකෙරේනම්; (දුකුළාවේ) අකප්පියෙ, අකපකර්මයෙහි; සමාදෙය්‍ය, (පස්සඩදැමියන්) සමාදන් කරවානම්; හෙවත් යොදවානම්(දුකුළාවේ)සභාගාපත්තියාපිච, සභාගාපත්තියද; * දෙසනාරොචනාදිම්හි, දෙසීමහා ආරොචනය කිරීමාදියෙහිද (දුකුළාවේ†-)

80 වස්සංනවසෙ, වස්නොවසානම්; (දුකුළාවේ) පටිස්සවං, (වසන්නෙමියි යනප්‍රතිඥව; විසංවාදෙ, විරුඬකරන්නාවූ; සුද්ධචිත්තෙ, සුඬවූසිත්ඇති භික්‍ෂුහට; (දුකුළාවේ) වස්සංවසිත්වා, වස්වැස; අනනුඤ්ඤාත කිච්චතො, අනුනොදත් කෘත්‍යයකින්; ගමනෙ, යාමෙහිද; (දුකුළාවේ-)

81 ආපදංවිනා, අන්තරායක්නැතිව; පොරිසම්හා, පුරුෂප්‍රමාණයෙන්; උද්ධං, මත්තෙහි; තරුස්ස, රුකට; අභිරූහණෙ, නැගීමෙහි(දුකුළාවේ)අපරිස්සාවනො, පෙරහන්නැතිතැනැත්තේ;අද්ධානං, දිඝීමාගීයට; ‡ වජෙ, යේනම්; (දුකුළාවේ) තං, ඒපෙරහන; යාචතො, ඉල්වන්නාහට; නදෙ,(යමෙක්)නොදෙනම්;(ඔහට දුකුළාවේ-)

82 අත්තනො ඝාතනෙ, (තමාවිසින්) තමාමැරීමෙහි දුකුළාවේ; ඉත්ථිරූපාදිං, ස්ත්‍රිරූපාදිය; කාරයෙය්‍යවා, (තෙමේකෙරේනම්;) අනුන්ලවා කරවානම්; (දුකුළාවේ) මාලාදිකං, මාලාදිවූ චිත්තං, විසිතුරුකම්; හිත්වා, තබා; ජාතකාදිං,ජාතකාදිවස්තුව, සයංකරෙ, තෙමේකෙරේනම්; (දුකුළාවේ-)

* සභාගනම් වස්තු ආපත්තිවසයෙන් ද්විවිධයි, ඉන්මෙහි වස්තු සභාගතාවයම අභිමතයි-

† දෙසනානම්,අගම්භන්තෙ සම්බහුලා යනාදියෙන් දෙසනාවයි, ආරොචනානම්, එසේනොකියා මමඅසවල් ඇවතට පැමිණියෙමියි කීමයි-

‡ අද්ධානයනී යටත් පිරිසෙයින් අඩයොදුන අභිමතයි-

83 භුඤ්ජනතා මුඛපෙහත්ථා සාලාදිසු නිසීදතො
වුඩ්ඪානම්පන ඔකාසං අදත්වාපි දුක්කටං

84 යානාදිමහිරූහෙයය කලලකොරතනත්තයං
ආරබ්භ*ද චෙවදෙඤ්ඤ පරිසායොප ලාලනෙ†

85 කායාදිං විවරිත්වාන භික්ඛුනීනංනිදස්සයෙ
වාචෙලොකායතංපලිතංගණ්හෙයය ගණ්හාපෙයයවා

86 යත්ථකත්ථචි පෙළායං භුඤ්ජන්තො පත්තහත්ථකො
වාතපානක වාටංවාපනා මෙසොදකම්පිච

83 භුඤ්ජන්තං, අනුභවකරන්නාහු; උඛ්පෙ, භූනාස්නෙත්නගා නම්; (දුකුළාවේ)භත්තශාලාදිසු,භොජනසාලාදිවල්හි; වුඩ්ඪානං, මහල්ලන්ට; ඔකාසම්පන, අවකාසය වනාහි; අදත්වා, නොදී; නිසිදතොවාපි, හිඳිනාහටද; දුකකටං, දුකුළා(වෙ)යි-

84 කලලකො, නොගිලන්වූයේ; යානාදිං, යානාදියට; අභිරූහෙයය, නගිනම්; (දුකුළාවේ) රතනත්තයං ආරබ්භ, රත්නත්‍රයඅරභයා; දවෙ, ක්‍රිඩාපිණ්ඩ; චදෙ, කියානම්; හෙවත් පරිහාස වසයෙන් කථාකෙරේනම්; (දුකුළාවේ) අඤ්ඤපරිසාය, අන්පිරිස්; උපලාළනෙ, නැලවීමෙහිද; හෙවත් වඤ්චා කථාවෙන්; ලොල්කරවීමෙහිද:(දුකුළාවේ-)

85 කායාදිං, කයආදිය; (ආදිශබ්දයෙන්; කලවය නිමිත්තය) විවරිත්වාන, විවෘතකොට; හෙවත් සිවුරුනගා; භික්ඛුනීනං, මෙහෙණින්ට; නිදස්සයෙ, දක්වානම් (දුකුළාවේ) ලොකායතං°, කාව්‍යනාටකාදි තිරශ්චිනවිද්‍යාව; වාචෙ, කියානම්; නොහොත් උගණිනම්; ‡ පලිතං, සුදුකෙස්; ගණ්හෙයයවා, (තෙමේම හෝ) ගණිනම්; ගණ්හාපෙයයවා, අනුන්ලවාහෝ ගන්වානම්(දුකුළාවේ)

86 යත්ථකත්ථචි, යම්කිසි; පෙළායං, තඹලෝආදියෙන්කළ පාතටුමත්තෙහි; (තබා) භුජතො,අනුභවකරන්නාහට; (දුකුළාවේ) පත්තහත්ථකො, පාත්‍රයගත් අත්ඇත්තේ; වාතපානකවාටංවා, ජනෙල්කවුළුහෝ;(වාශබ්දයෙන්)දොරකවුළුහෝපණාමෙ,හරිනම්; දුකුළාවේ සොදකම්පිච, දියසහිත හෙවත් තෙත්පාත්‍රයද; මතුසම්බන්ධයි-

* (වදෙදවඤ්ඤ,)යීද(වදෙදවායඤ්ඤ)යීද, (රචෙචවදෙඤ්ඤ)යීද, ඇතම්පොත් වලතිබේ-

† පලොභනෙ, යීඅභිනවටීකාවෙහිතිබේ-විවරණයද ඒගැණම කරතිබේ-

‡ ඉගැන්වීමත් මෙහිම සඞ්ග්‍රහයි-

87 උණ්හයය පටිසාමෙය්‍ය අතිඋණ්හයය වොදකං ඨපෙය්‍යභූමියං පත්තං අඩෙකවා මචපීඨකෙ,

88 මිඩ්ඪන්තෙ පරිභණ්ඩන්තෙ පාදෙජන්තෙ ඨපෙය්‍යවා චලකාදිං ඨපෙපත්තෙ පත්තෙවා හත්ථධොවනෙ,

89 පත්තෙන නීහරන්තස්ස උච්ජිඨ මුදකම්පිච අකප්පියම්පි පත්තංවා පරිභුඤ්ජෙය්‍ය දුක්කටං,.

90 වදෙජීවාති ඛිපිතෙන සික්ඛති අනාදරො පරිමණ්ඩලකාදිමහි සෙබියෙ දුක්කටංසියා,

---

87 උණ්හෙයය, උණුහුම්කොරේනම්; (දුකුළාවේ) පටිසාමෙයය හැන්පත්කෙරේනම්; (දුකුළාවේ) වොදකං, පහවූ දියඇති පාත්‍ර ය; අතිඋණ්හෙයය, ඉතාඋණුහුම් කොරේනම්;(දුකුළාවේ)පත්තං, පාත්‍රය; භූමියංවා, බිමහෝ; අඩෙකවා, ඇකෙහිහෝ; මචපීඨකෙ වා, ඇඳපුටුවෙහිහෝ; ඨපෙයය, තබානම්; (දුකුළාවේ-)

88 මිඩ්ඪන්තෙවා, අලින්දුවසානයෙහිද; පරිභණ්ඩන්තෙවා, පි ල්කෙලවරද; පාදෙවා, පිටිපයෙහිද; ජත්තෙවා, ඡත්‍රයෙහිද; ඨ පෙයයවා, තබානම්හෝ; (දුකුළාවේ) පත්තෙ, පාත්‍රයෙහි; චල කාදිං, මත්ස්‍යමාංස කටුඇටආදිය; ඨපෙ, තබානම්; (දුකුළා වේ) පත්තෙ, පාත්‍රයෙහි; හත්ථ ධොවනෙවා, අත්සේදීමෙහිද; (දුකුළාසි)

89 උච්ජිඨංඋදකම්පිච, ඉඳුල්දියද; පත්තෙන, පාත්‍රයෙන්; නී හරන්තස්ස, ගෙණයන්නාහට; (දුකුළාවේ) අකප්පියම්පි, අකපවූ ද; පත්තංවා, පාත්‍රයක්හෝ; * පරිභුඤ්ජෙයය, පරිභොග කෙරේන ම්; දුක්කටං, (දුකුළාවේ-)

90 ඛිපිතෙ, කිඹිස්සකල; ජීවඉති, ජීවත්වේවයි නොහොත් ජී වත්වෙහි වායයි; † වදෙ, කියානම්; (දුකුළාවේ) පරිමණ්ඩලකා දිම්හි, පිරිමඬුළු ආදිවූ; සෙබියෙ, පන්සැත්තෑවක් සෙඛිය යෙහි; අනාදරෙ, අනාදරවූයේ; නසික්ඛති, නොහික්මේනම්; දුක්කටංසියා (දුකුළාවේ)

---

* අකප පාත්‍රනම්, ඈරුමයපාත්‍රාදියයි විස්තර ටීකායෙන් දතයුතු

† අනුන් කිවුට ආවඩානම්සී පුරාණ සන්නයි-

91 යොභණ්ඩාගාරෙ පසුතොව * භණ්ඩකං මාතුන
පාචිත්තිය මස්සගොපයෙදවාය හීනේනාපි
ජාතිආදිනා වදෙය්‍ය දුබ්භාසිත මුත්තමම්පියො
පකිණ්ණක නිද්දෙසො-

92 උපජ්ඣාචෙර වත්තව ගමිකාගන්තු කම්පිච
සෙනාසනාදි වත්තව කාතබ්බංපිය සිලිනා,
93 හත්ථපාසෙඨිතොකිඤ්චි ගහිතබ්බං දදෙතිධා
ගහෙතුකාමො ගණ්හාත්‍ය විධාය සම්පටිග්ගහො

91 යො, යම්භික්‍ෂුවක්තෙම; භණ්ඩාගාරෙ, භාණ්ඩාගාරයෙහි; පසුතොව, යුක්තවූයේම; මාතුනං, මව්පියන්ගේ; භණ්ඩකං, බඩුවක්; පවා † ගොපයෙ, තබාරක්නම්: අස්ස, ඕහට; පාචිත්තියං, පචිති ඇවැත්(වෙයි) යො, යම්භික්‍ෂුවක්තෙම; උත්තමම්පි, උත්තමජාති ඇත්තෙකුටද; අපිශබ්දයෙන් හීනජාති ඇත්තෙකුටද; හීනෙනජාතිආදිනා, අපි, හීනජාත්‍යාදියකින්ද; (අපි ශබ්දයෙන්) උත්තම ජාත්‍යාදියකින්ද; දවාය, ක්‍රීඩාපිණිස; වදෙය්‍ය, කියා නම්; දුබ්භාසිතං, දුර්භාසිත ආපත්තිවේ-

පකිණ්ණක නිද්දෙසො-ප්‍රකීර්ණක නිර්දෙශයි-

92 උපජ්ඣාචෙර වත්තව, උපාධ්‍යායවතද ඇදුරුවතද; ගමිකං, ගමිකවතද; ආගන්තුකම්පිච, ආගන්තුකවතද; සෙනාසනාදි වත්තව, සෙනසුන්ආදිවතද;(ආදිශබ්දයෙන් හත්තාග්‍ර ගිණිහල්වැසිකිලිවත්)පියසීලිනා, සීලකාමීහුවිසින්; කාතබ්බං,කළයුක්තෙයි

93 හත්ථපාසෙඨිතො, අත්පසෙහි සිටියාවූ දෙනුකැමැති තැනැත්තේ; ගහිතබ්බං, එක්පුරුෂයෙකු විසින් ගතහැකි නොහොත් එසවිය හැකිවස්තුවක්; තිධා, තුන්ප්‍රකාරයෙකින්; දදෙ, දේනම්; ගහෙතුකාමො, ගනුකැමැත් භික්‍ෂුතෙම; ද්විධා, දෙපරිද්දෙකින්; ගණ්හෙය්‍ය, ගන්නේය; අයං, මේ; සම්පටිග්ගහො, මනාවූ පිළිගැන්මයි ‡

* පසුතොවයිද පාඨයි-

† මෙහි අපිශබ්ද නොයොදන ලදුවත් ගම්‍යමානාර්ථවශයෙන් සලකා බඩුවක් පවායි අර්ථකථනය කරණලදී-

‡ මෙහිඅත්පසනම් දෙරියන් හමාරකි, හෝඅත්පසතෙම උන්නාවූ භික්‍ෂුවගේ පශ්චිම කෙළවර පටන්යට සිටිය භික්‍ෂුවගේ විළුඹකෙළවර පටන්ය, වැදහොත්තාවූ භික්‍ෂුවගේ වැදහොත් පාර්ශ්වයාගේ එහාකෙළවර පටන්ය, උන්නාවූහෝ සිටියාවූහෝ වැදහොත්තාවූහෝ දායකයාගේ දික්කළ හස්තය තබායම් අවයවයක් ඉතාආසන්නද ඒ අවයවයාගේ මෙහාපැත්තේ කෙළවරින් පරිසිඳ දතයුක්තෙයි-

94 සඞ්ඝාටිමුත්තරා සඞ්ගං තථා අන්තරවාසකං
එතං ඉමං අධිට්ඨාමි තථා පච්චුද්ධරාමිති,
95 ඉමං ඉමානි එතානි එතම්පිචීවරනිවා
පරික්ඛාර චොළානිනි තථා පච්චුද්ධරාමිති,
96 එතං ඉමං අධිට්ඨාමි පත්තං පච්චුද්ධරාමිති
එවං පච්චුද්ධරෙට්ඨෙ චීවරාදිං යථාවිධි,
97 සවරිත්තං විනා සෙසා සචිත්තා ගරුකන්තිමා
අච්ඡින්නං පරිණතං හිත්වා නිස්සග්ගිය මචිත්තකං.

---

94 සඞ්ඝාටිං, සඟල සිවුරද; උත්තරාසඞ්ගං, උත්තරාසංගයාද; තථා, එපරිද්දෙන්; අන්තරවාසකං, අඳනයද; එතං ඉමං අධිට්ඨාමි ඉති, එතං අධිට්ඨාමි ඉමං අධිට්ඨාමිසි කියාද; තථා, එපරිද්දෙන්; පච්චුද්ධරාමි ඉති, එතං පච්චුද්ධරාමි ඉමං පච්චුද්ධරාමියි, කියාද-මිතුසම්බන්ධයි-†

95 අපි, නැවත; ඉමං චීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමිඉති, ඉමං චීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමි,යි කියාද, ඉමානිචීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමිඉති, ඉමානිචීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමි,යි කියාද, එතානිචීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමිඉති, එතානිචීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමි,යි කියාද, එතංචීවරංපරික්ඛාරචොළං අධිට්ඨාමිඉති, එතංචීවරං පරික්ඛාරචොළං අධිට්ඨාමි,යි කියාද, තථා, එපරිද්දෙන්; පච්චුද්ධරාමිඉති, ඉමංචීවරං පරික්ඛාරචොළං පච්චුද්ධරාමි,යි කියාද; ඉමානි චීවරානි පරික්ඛාරචොළානි පච්චුද්ධරාමි,යි කියාද; එතානිචීවරානි පරික්ඛාරචොළානි, පච්චුද්ධරාමි,යි කියාද, එතංචීවරං පරික්ඛාරචොළං පච්චුද්ධරාමියි කියාද; මිතුසම්බන්ධයි-

96 එතං ඉමං පත්තං අධිට්ඨාමිඉති, එතං පත්තං අධිට්ඨාමි ඉමං පත්තං අධිට්ඨාමි,යි කියාද; එතං ඉමං පත්තං පච්චුද්ධරාමිඉති, එතං පත්තං පච්චුද්ධරාමි, ඉමං පත්තං පච්චුද්ධරාමි,යි කියාද; එවං, මෙසේ; චීවරාදිං, සිවුරුආදිය; යථාවිධි, විධිවූපරිද්දෙන්; පච්චුද්ධරෙ, පච්චුද්ධරණයකරන්නේයි-අධිට්ඨෙ, ඉටන්නේයි;.

97 සවරිත්තං, සවරිත්ත සංඝාදිසෙසය; විනා, හැර; සෙසා, සෙසු; ගරුකන්තිමා, සංඝාදිසෙසහා පාරාජිකාපත්තිහු; සචිත්තා, සචිත්තකයෝයි; අච්ඡින්නං, අච්ඡින්න සික්ඛාපදයද; පරිණතං, (තමහට පිරිනැමීමයයි කියනලද) පරිණතසික්ඛාපදයද; හිත්වා, තබා; නිස්සග්ගියං; (සෙසු) නිසගි (පචිති)අචිත්තකං, අචිත්තකයි

---

† දුරතිබෙන සිවුර තුබූතැන්සලකා එතංයීද අත්පසතුබූසිවුර අතින් ආමශ්‍රිතයකොට ඉමංයීද කියයුතුයි, එතංඅධිට්ඨාමි, යනමේ පදයන්ගේ මධ්‍යයෙහි, සංඝාටිං, යනාදිය වෙන්වෙන්ව යොදා තුන්සිවුරු ඉටන්නේයි-කෙසේද, එතංසංඝාටිං අධිට්ඨාමි ඉමංසංඝාටිංඅධිට්ඨාමි, යනාදීවසයෙනි, සෙසුසිවුරයනාහිද මෙමනායයි-

98 පදසොධම්මං දුවෙසෙය්‍යා ඉත්ථියාධම්මදෙසනා
දුවෙසෙනා සනානිපි සිබ්බනං චීවරසසපි,
99 පවාරිතං සුරාපානං පචසන්නිධි ආදිකං
ජොතිනුජ්ජාල නචෙව කප්පබින්දුමනාදියං*,
100 ගාමප්පවෙසනඤ්ඤතෙ පාචිත්තිසු අචිත්තකා
පකිණ්ණකෙසු උද්දිස්සකතං හිත්වාඤ්ඤමංසකං,.
101 එකත්ථරණපාපුරණං එකමචෙතු වට්ටනං
එකතොභුජනචාපි නච්චගීතාදි සත්තපි,

---

98 පදසොධම්මං, පදවසයෙන් බනකියමනෙහි පනවනලදසික්‍ෂාවද; දුවෙසෙය්‍යා, සෙය්‍යාවෙහි පනවනලද දෙසික්‍ෂාවෝද; ඉත්ථියාධම්මදෙශනා, මාගමට බණකීමෙහි පනවනලද සික්‍ෂාවද; දුවෙසනා සනානිපි, සෙනසුන්හි පනවනලද දෙසික්‍ෂාවෝද; චීවරස්සසිබ්බනංඅපි, සිව්රුගෙත්තම්හි පනවනලද සික්‍ෂාවද;.

99 පවාරිතං, ප්‍රථම පවාරිතයෙහි පනවනලද සික්‍ෂාවද; සුරාපානං, සුරාපානයෙහි පනවනලද සික්‍ෂාවද; පචසන්නිධි ආදිකං, සන්නිධිආදිවූ සික්‍ෂාපසද; † ජොතිනුජ්ජාලනචෙව, ගිණිදැල්වීමෙහි පනවනලද සික්‍ෂාවද; කප්පබින්දුමනාදියං, කප්බින්දුනොගැන්මෙහි පනවනලද සික්‍ෂාවද;.

100 ගාමප්පවෙසනන්තා, ගම්වැදීමෙහි පනවනලද සික්‍ෂාව අවසන්කොටඇති; එතෙ, මේ(සතලොස්) සික්‍ෂාවෝ; පාචිත්තිසු (දෙඅනූ) පචිතීන් අතුරෙන්; අචිත්තකා, අචිත්තකයෝයි; (සෙසු පචිතිසචිත්තකයි) පකිණ්ණකෙසු, ප්‍රකීර්ණකයන් අතුරෙන්; උද්දිස්සකතං, උද්දිස්සකතනම්වූ සික්‍ෂාව; හිත්වා, හැර; අඤ්ඤමංසකං, සෙසුමස් විෂයෙහි පනවනලද සික්‍ෂාවද;.

101 එකත්ථරණපාපුරණං, එකත්ථරණපාපුරණනම් සික්‍ෂාපදද; එකමචෙතුවාටනං, එක්හැඳසයනයෙහිපනවනලදසික්‍ෂාවද; එකතො භුජනචාපි, එක්ව වැලඳීමෙහි පනවනලද සික්‍ෂාවද; නච්චගීතාදි,නෘත්‍යගීතාදිවූ; සත්තපි, සික්‍ෂාපදසතද-මතුසම්බන්ධයි ‡

---

* මනාදිකං,සී සමහර,

† සන්නිධිආදිවූ සික්‍ෂාපසනම්, සන්නිධිසික්‍ෂාවය, විකාලභොජනය සික්‍ෂාවය, ප්‍රණීත භොජන සික්‍ෂාවය, දන්තපොනසික්‍ෂාවය තිත්ථියදුන සික්‍ෂාවය යනපසයි.

‡ නෘත්‍යගීතාදි සික්‍ෂාසතනම්, නෘත්‍යගීත බැලීමහා ඇසීමද, මලආදිය දැමීමද දික්කෙස් ආදියදැරීමද, නියමට කිරීම්ආදියද සම්බාධපියස රොමහැරීමද, සළුපාගණව පිරියම්කළබිම ඇක්මීමද, යනසතයි.

102 අකාය බන්ධනචාපි පත්තහත්ථක වාටකං
අචිත්තකමිදං සබ්බංසෙසමෙත්ථ සචිත්තකං,

103 වීතික්කමන චිත්තෙන සචිත්තක මචිත්තකං
පඤ්ඤත්ති ජානනෙනාපි වදන්තා චරියාතථා,

104 පුබ්බකරණාදිකංකත්වා උපොසථපවාරණං
නවධාදීපිතංසබ්බං කාතබ්බංපියසීලිනා,

105 පාරිසුද්ධි අධිට්ඨාන සුත්තුද්දෙස වසාතිධා
ගණපුග්ගල සංඝොච තංකරෙය්‍ය යථාක්කමං,

---

102 අකායබන්ධනචාපි, අකායබන්ධන සික්ෂාවද: පත්තහත්ථකවාටකං, පත්තහත්ථක වාටකනම් සික්ෂාවද යන; ඉදංසබ්බං, මේසියළු සික්ෂාසමූහය; අචිත්තකං, අචිත්තකයි; එත්ථ, මෙහි; සෙසං, සෙස්ස; සචිත්තකං, සචිත්තකයි;.

103 පඤ්ඤත්තිජානනෙනාපි, ප්‍රඥප්තිය දැනීමෙන්ද; වීතික්කමනචිත්තෙන, ව්‍යතික්‍රමන චිත්තය කරණකොටගෙණ පැමිණියයුතුහෙයින්; සචිත්තකං, සචිත්තකයයිද; තථා, එපරිද්දෙන්; පඤ්ඤත්ති ජානනෙනාපි, ප්‍රඥප්තිය දැනීමෙන්ද; නොදැනීමෙන්ද; වීතික්කමන චිත්තෙන, ව්‍යතික්‍රමන චිත්තය කරණකොටගෙණ; නොපැමිණියයුතුහෙයින්; අචිත්තකං, අචිත්තකයයිද; ආචරියා, ආචාර්‍ය්‍යයෝ; වදන්ති, කියත්;†.

104 පුබ්බකරණාදිකං, පූර්‍වකරණාදිය; (ආදිශබ්දයෙන් පූර්‍වකෘත්‍ය) කත්වා, කොට; නවධා, නවප්‍රකාරයෙන්; දීපිතං, ප්‍රකාශකළ; සබ්බං, සියළු; උපොසථ පවාරණං, පොහොපවුරුණු; පියසීලිනා, සික්ෂාකාමීහු විසින්; කාතබ්බං, කළයුතුකෙතයි.

105 පාරිසුද්ධි, පිරිසිදු පොහොයද; අධිට්ඨාන, ඉටන්පොහොයද; සුත්තුද්දෙශ, පාමොක් උදෙසන පොහොයද; වසා, යනමොවුන්ගේවසයෙන්; තිධා, උපෝසථය තුන්පරිද්දෙකින්වේ; තං, ඒඋපෝසථය; ගණපුග්ගලසංඝොච, ගණයාද පුද්ගලයාද සංඝයාද; යථාක්කමං, ක්‍රමය නොසික්ම; හෙවත් පිළිවෙලින්; කරෙය්‍ය, කරන්නේය.

---

†සචිත්තක අචිත්තකයන්ගේ කවරවෙනසෙක්දයත් සචිත්තකය ලෝකවද්‍යය අචිත්තකය ප්‍රඥප්තිවද්‍යයි. සචිත්තකය බොහෝසෙයින් අකුසලචිත්තය, අචිත්තකය බොහෝසෙයින් කුසලාකුසල අව්‍යාකෘතවසයෙන්; ත්‍රිචිත්තයි.

106 චාතුද්දසො පණ්ණරසො සාමග්ගී දිනතො තිධා
දිනපුග්ගල කත්තබ්බා කාරතො තෙන වෙරිතා,
107 තයො තයොති කත්වාන දිනපුග්ගලභෙදතො
තෙවාචිමෙකවාචිනි නවවුත්තා පවාරණා,
අපිච, අපරෙනයො වෙදිතබ්බා.
108 කත්තිකන්තිමපක්ඛම්හා හෙමං එග්ගුණ පුණ්ණමා
තස්සඅන්තිමපක්ඛම්හා ගිම්හාආසාළ්හිපුණ්ණමා,
විස්සකාලං තතොසෙසා චතුවීසතුපොසථා

106 චාතුද්දසො, තුදුස්වක්පොහොය; පණ්ණරසො, පසළොස්වක්පොහොය; සාමග්ගී, සමගිපොහොය;(යි) දිනතො, දවස් විසින්; තිධා, තුන්පරිද්දෙකින්වේ; දිනපුග්ගල කත්තබ්බාකාරතො, දවස්පුද්ගල කටයුතු ආකාරයෙන්; තෙ, ඒ උපොසථවිභාගයෝ; නව, නවයෙකැයි; ඊරිතා, කියනලද්දහ.

107 දිනපුග්ගල භෙදතො, දවස්පුද්ගල භෙදයෙන්; තයොතයොඉති, තුනෙක් තුනෙක්යයි; කත්වාන, කොට; තෙවාචිමෙකවාචින්, තෙවාචිකා පවුරුණුය, වෙවාචිකා පවුරුණුය, එකවාචිකාපවුරුණුයයිද; නවපවාරණා, නවපවාරණයෝ; වුත්තා, කියනලද්දහ*; අපිච, තවද; අපරෙණයො, අනුක්‍රමයෙන් තෙම; වෙදිතබ්බා, දතයුත්තෙයි

108 කත්තිකන්තිමපක්ඛම්හා (පශ්චිමකාර්තික හෙවත් ඉල්මස අවපෑලවියපටන්; එග්ගුණ පුණ්ණමා, මැදිනමස මැදිපොහොයදක්වා; හෙමං, හේමන්තසෘතුනම්; තස්ස, ඒමැදින මාසයාගේ; අන්තිමපක්ඛම්හා, අන්තිම පක්ෂයගෙවත් අවපෑලවියපටන්; ආසළ්හිපුණ්ණමා, ඇසළමැදිපොහොය දක්වා; ගිම්හං, ගිම්හානසෘතුනම්; තතො, ඒසෘතුදෙකින්; සෙසං, අවශෙෂය; නොහොත් ඇසළමස අවපෑලවිය පටන් පශ්චිම කාර්තික හෙවත් ඉල්මස මැදිපොහොයදක්වා; වස්සකාලං, වස්සානසෘතුනම්; චතුවීසතිඋපොසථා, එකොනි සෘතුවෙක්හි පොහො අටක් අටක්යයි සූවිස්සක් උපොසථයෝවෙත්.

* චාතුද්දශී, පවුරුණුය; පණ්ණරසී, පවුරුණුය; සමගපවුරුණුයයි; දවස්හෙයින්, තුනක්ද පුද්ගලපවුරුණුය, ගණපවුරුණුය, සඟපවුරුණුයයි පුද්ගලභෙදයෙන්, තුනක්ද කොටයයිසේයි; එහිචාතුර්දශිපවුරුණුනම් පූර්වකාර්තික හෙවත් වප්මස කළුවරපක්ෂයයි; පණ්ණරසීනම් විවිධවූ පූර්වපශ්චිම කාර්තික හෙවත් වප්ඉල් පුණ්ණමාසවයයි; සමගපවුරුණුනම් ප්‍රථමපවුරුණුතබා පෑළවිය පටන් පශ්චිම කාර්තික පොහොයදක්වා මේඅනුරෙහි; සංඝයා සමගිවූ සම්දවසස කළයුත්තියි.

109 චාතුද්දසාඡ එතෙසු පක්ඛාතතිය සත්තමා,
සෙසාපණ්ණරසාඤෙය්‍යා අට්ඨාරසඋපොසථා

110 ඡන්දංදම්මි ඡන්දං මෙහරඡන්දං
මෙආරොචෙහීති ඡන්දං දාතබ්බං

111 පාරිසුද්ධිංදම්මිපාරිසුද්ධිං මෙහර පාරිසුද්ධි
මෙආරොචෙහීති පාරිසුද්ධි දාතබ්බා.

112 පවාරණං දම්මිපවාරණං, මෙහරපවාරණං
මෙආරොචෙහි මමත්ථාය පවාරෙහීති පවාරණාදාතබ්බා,

---

109 එතෙසු, මේතුන් සෑතූන්අතුරෙන්; නොහොත් මේඋපොසථයන් අතුරෙන්; තතියසත්තමාපක්ඛා, එකොහි සෑතුවෙක්හි තුන්වෙනි සත්වෙනි පක්ෂයෝ; ඡ, සදෙන; චාතුද්දසා, තුදුස්වක්හුයි; සෙසා, සෙසු; අට්ඨාරසඋපොසථ, අටළොස් උපොසථයෝ; පණ්ණරසා, පණ්ණරසීහුයයි; ඤෙය්‍යා, දතයුත්තාහුයි.

110 ඡන්දංදම්මිඡන්දං මෙහරඡන්දංමෙආරොචෙහිඉති, ඡන්දංදම්මි ඡන්දං මෙහරඡන්දං මෙආරොචෙහි යී කියා; ඡන්දං, ඡන්දයහෙවත් කැමැත්ත; දාතබ්බං, දියයුත්තේයි*

111 පාරිසුද්ධිංදම්මිපාරිසුද්ධිං මෙහරපාරිසුද්ධිං මෙආරොචෙ හීති, පාරිසුද්ධිංදම්මිපාරිසුද්ධි මෙහරපාරිසුද්ධිං මෙආරොචෙහි,යී කියා පාරිසුද්ධි, පාරිසුද්ධිතොමෝ; දාතබ්බා, දියයුත්තීය.†

112 පවාරණංදම්මි පවාරණංමෙහර පවාරණ මෙආරොචෙහි මමත්ථාය පවාරෙහිඉති, පවාරණංදම්මිපවාරණං මෙහරපවාරණං මෙආරොචෙහි මමත්ථාපවාරෙහි,යී කියා පවාරණා, පවුරුණු තොමෝ; දාතබ්බා, දියයුත්තීය.‡

---

* ඡන්දං, කැමැත්ත; දම්මි, දෙමි; මෙ, මාගේ; ඡන්දං, කැමැත්ත හර, ගෙණයව; මෙ, මාගේ; ඡන්දං, කැමැත්ත; ආරොචෙහි, කියව; යනුමෙහි අර්ථයි–

† පාරිසුද්ධි , පිරිසිදු; දම්මි, දෙමි; මෙ, මාගේ; පාරිසුද්ධිං, පිරිසිදුබව; හර, ගෙණයව; මෙ, මාගේ; පාරිසුද්ධිං, පිරිසිදුබව; ආරොචෙහි, කියව; යනුමෙහි අර්ථයි.

‡ පවාරණං, පවුරුණු; දම්මි, දෙමි; මෙ, මාගේ; පවාරණං, පවුරුණු; හර, ගෙණයව: මෙ, මාගේ; පවාරණං,පවුරුණු; ආරොචෙහි, කියව; මමත්ථාය, මාපිණිස; පවාරෙහි, පවරව; යනුමෙහිඅර්ථයි.

113 ආපත්තිදෙසකෙන අහම්භන්තෙ සම්බහුලා නානාවත්ථුකා ආපත්තියො ආපජ්ජිංතා තුම්හමූලෙ පටිදෙසෙමීති වත්තබ්බා පස්සසිආවුසොතාආපත්තියොතිපටිග්ගණ්හන්තෙනවුත්තෙන ආමභන්තෙපස්සාමීතිවත්තබ්බාපුනපටිග්ගණ්හන්තෙනආයතිං, ආවුසො සංවරෙය්‍යාසීතිවුත්තෙන, සාධුසුට්ඨුභන්තෙ සංවරිස්සාමීති තික්ඛත්තුංවත්තබ්බාදෙසෙතබ්බා.

---

113 ආපත්තිදෙසකෙන, ඇවැත්දෙසන්නාහු විසින්; අහම්භන්තෙසම්බහුලාඃ නානාවත්ථුකා ආපත්තියො ආපජ්ජිංතා තුම්හාමූලෙපටිදෙසෙමිඉති, අහම්භන්තෙ සම්බහුලා නානාවත්ථුකා ආපත්තියො ආපජ්ජිංතා තුම්හමූලෙ පටිදෙසෙමි,යී; වතනවා, කියා; පස්සසි ආවුසොතා ආපත්තියොඉති, පස්සසිආවුසොතා ආපත්තියො,යී; පටිග්ගණ්හන්තෙන, පිළිගන්නාහු විසින්; වුත්තෙ,කීකල්හි; ආමභන්තෙ පස්සාමිඉති, ආමභන්තෙ පස්සාමි,යී; වත්තබ්බා, කියා; පුන, නැවත; පටිග්ගණ්හන්තෙන, පිළිගන්නාහු විසින්; ආයතිංආවුසොසංවරෙය්‍යාසීති, ආයතිංආවුසොසංවරෙය්‍යාසි,යී වුත්තෙන, කීකල්හි; සාධුසුට්ඨුභන්තෙ සංවරිස්සාමිඉති, සාධුසුට්ඨුභන්තෙසංවරිස්සාමි,යී තික්ඛත්තුං, තුන්යලක්; වත්තබ්බා, කියා, දෙසෙතබ්බා, දෙසියයුක්තීය.†

---

† භන්තෙ, ස්වාමිය; අහං, මම; සම්බහුලා, බොහෝ නානාවත්ථුකා, නොයෙක් වස්තුඇත්තාවූ; ආපත්තියො, ආපත්තීන්ට; ආපජ්ජිං, පැමිණියෙමි; තා, ඒආපත්තීන්; තුම්හමූලෙ, තොපකෙරෙහි; පටිදෙසෙමිඉති, දෙසමියි ද්‍යෙහෝනොහොත් ප්‍රකාශකෙරෙමියි; වත්තබ්බා, කියා; පටිග්ගණ්හන්තෙන, පිළිගන්නාහු විසින්: ආවුසො, ඇවැත: තාආපත්තියො, ඒආපත්තීන්; පස්සසිඉති, දක්නෙහිදැයි; වුත්තෙ, කීකල්හි; භන්තෙ, ස්වාමිය; ආම, එසේයීඃ පස්සාමීති, දකිමියි; වත්තබ්බා, කියා; පුන, නැවත; පටිග්ගණ්හන්තෙන, පිළිගන්නාහු විසින්; ආවුසො, ඇවැත; ආයතිං, මත්තෙහි සංවරෙය්‍යාසීති, සංවරයෙහි සිටුවයි; වුත්තෙ, කීකල්හි; භන්තෙ, ස්වාමිය; සාධු, යහපත; සුට්ඨු, මනාකොට; සංවරිස්සාමීති, සංවරයෙහි සිටින්නෙමියි; තික්ඛත්තුං, වත්තබ්බා, තුන්යලක්කියා; දෙසෙතබ්බාඃ, දෙසියයුක්තීය; යනුමෙහි අර්ථයි-

114 විමතිං*ආරොචෙනෙතන-අහංභනෙතසම්බහුලාසු
නානා වත්ථුකාසු ආපතතීසු වෙමතිකො යදා
නිබ්බෙමතිකො භවිස්සාමි තදා තා ආපතතියො
පටිකරිස්සාමීතිතිකඛතතුං වතවාආරොචෙතබ්බා,
115 අජ්ජමෙ උපොසථො පණ්ණරසො චාතුද්දසො
තිවා අධිට්ඨාමීති තිකඛතතු වතවා පුග්ගලෙන
අධිට්ඨානුපොසථො කාතබ්බො,
116 වීසුපනථෙරෙන, පරිසුද්ධොඅහං ආවුසොපරි
සුද්ධොතිමං ධාරෙහීති තිකඛතතුංවතතබ්බං,

114 විමතිං, විමතිය; ආරොචෙන්තෙන, කියන්නාහු විසින්; අහංභන්තෙසම්බහුලාසු නානාවත්ථුකාසු ආපත්තීසු වෙමතිකො යදානිබ්බෙමතිකො භවිස්සාමි තදාතා ආපත්තියොපටි කරිස්සාමි ඉති, අහංභන්තෙ සම්බහුලාසු නානාවත්ථුකාසු ආපත්තීසු වෙමතිකොයදානිබ්බෙමතිකො භවිස්සාමිතදාතා ආපත්තියොපටි කරිස්සාමි,යී තිකඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; ආරොචෙතබ්බා, ආරොචනය කළයුත්තීය.†

115 අජ්ජමෙඋපොසථො පණ්ණරසොඉතිවා, අජ්ජමෙඋපොසථොපණ්ණරසො,යී හෝ; චාතුද්දසොඉතිවා, අජ්ජමෙඋපොසථො චාතුද්දසො,යී හෝ; අධිට්ඨාමිඉති, අධිට්ඨාමි,යී තිකඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පුග්ගලෙන, පුද්ගලයා විසින්; අධිට්ඨානුපොසථො, ඉටන්පොහොතෙම; කාතබ්බො, කළයුත්තෙයී.‡

116 වීසුපන, දෙදෙනාඅතුරෙහි වනාහි; ථෙරෙණ, මහල්ලහු විසින්; පරිසුද්ධොඅහංආවුසො පරිසුද්ධොතිමංධාරෙහීති, පරිසුද්ධො අහංආවුසො පරිසුද්ධොති මංධාරෙහියී; තිකඛත්තුං, තුන්යලක්, වතතබ්බං, කියයුත්තෙයි§

* වෙමති.යීදතිබේ.

† භන්තෙ, වහන්ස; අහං, මම; සම්බහුලාසු, බොහෝවූ; නානාවත්ථුකාසු, නානාවස්තු ඇත්තාවූ; ආපත්තීසු, ආපත්තිවල්හි; වෙමතිකො, විමතිඇත්තෙක්මි; යදා, යම්කලෙක; නිබ්බෙමතිකො භවිස්සාමි, විමතිනැත්තෙක්වන්නෙම්ද; තදා,එකල්හි; තාආපතතියො, ඒආපත්තීන්;පටිකරිස්සාමි,පහළකරන්නෙමි;යනුමෙහිඅර්ථයි.

‡ අජ්ජ, අද; මෙ,මාගේ; උපොසථො, පොහොතෙම; පණ්ණරසො, පසළොස්වක් වන්නේය නොහොත්; චාතුද්දසො, තුදුස්වක්වන්නේය; අධිට්ඨාමි, එයඉටමි; යනුමෙහි අර්ථයි.

§ ආවුසො, ඇවත; අහං,මම; පරිසුද්ධො, පිරිසිදුයෙමි; පරිසුද්ධොති, පිරිසිදුයයි; මං,මා; ධාරෙහි, දරව; යලකව, යනුමෙහිඅර්ථයි.

117 නවකෙනාපි තථෙව වත්තබ්බං, අහං භන්තෙ
මංධාරෙථාති වචනමෙව විසෙසො,

118 තිසුපන සුණාතු මෙ ආයස්මන්තො අජ්ජුපොසථො
පණ්ණරසො චාතුද්දසො තිවා, යදායස්මන්තානං පත්ත
කල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධි* උපොසථං කරෙය්‍යා
මාති ඤත්තිං ඨපෙත්වා පටිපාටියා වුත්තන යෙනෙව
පාරිසුද්ධි උපොසථො කාතබ්බො.

119 අජ්ජමෙපවාරණා පණ්ණරසී චාතුද්දසීතිවා
අධිට්ඨාමීති තික්ඛත්තුං වත්වා එකෙනපවාරෙතබ්බං

---

117 නවකෙනාපි, නවකයාවිසින්ුදු; තථෙව, එපරිද්දෙන්ම; වත්තබ්බං, කියයුක්තෙයි; අහංභන්තෙමංධාරෙථාති, අහංභන්තෙමංධාරෙථ, යන; වචනමෙව, වචනයම; විසෙසො, වෙනසි.†

118 තිසුපන, තුන්දෙනා අතුරෙහි වනාහි; සුණන්තුමෙ ආයස්මන්තො අජ්ජුපොසථො පණ්ණරසොඉතිවා, සුණන්තුමෙආයස්මන්තො අජ්ජුපොසථො පණ්ණරසො,යි කියාහෝ;චාතුද්දසොඉතිවා,සුණන්තුමෙ ආයස්මන්තො අජ්ජුපොසථො චාතුද්දසො,යි කියාහෝ; යදායස්මන්තානං පත්තකල්ලං මයංඅඤ්ඤමඤ්ඤං පාරිසුද්ධිඋපොසථං කරෙය්‍යාමාති යදායස්මන්තානං පත්තකල්ලංමයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධිඋපොසථං කරෙය්‍යාම,යි ඤත්තිං, ඤත්තිය; ඨපෙත්වා, තබා; පටිපාටියා, මහළුපිළිවෙළින්; වුත්තනයෙනෙව, යටකියනලද්ක්‍රමයෙන්ම; පාරිසුද්ධිඋපොසථො, පිරිසිදුපොහොතෙමේ; කාතබ්බො, කළයුක්තේයි ‡

119 අජ්ජමෙපවාරණා පණ්ණරසීඉතිවා,අජ්ජමෙපවාරණා පණ්ණරසීයයි කියාහෝ; චාතුද්දසීඉතිවා, අජ්ජමෙපවාරණා චාතුද්දසීයයිකියාහෝ; අධිට්ඨාමීති,අධිට්ඨාමියි; තික්ඛත්තුං, තුන්යලක්;වත්වා කියා; එකෙන, එකනමක්විසින්; පවාරෙතබ්බං, පැවරියයුතුයි.§

---

* පාරිසුද්ධිංයී, සම්හර.

† අහංභන්තෙමංධාරෙථාති, වචනමෙව විසෙසො යයිකියනලදබැවින්;පරිසුද්ධොඅහම්භන්තෙපරිසුද්ධොතිමංධාරෙථ,යීබිණියයුතු

‡ ආයස්මන්තො, ආයුස්මත්හු; මෙ, මාගියන්නක්; සුණන්තු, අසත්වා; අජ්ජුපොසථො, අදපොහොතෙම; පණ්ණරසො, පණ්ණරසීවෙයි; වා, නොහොත්; චාතුද්දසොති,චාතුද්දසීවෙයි;යදි,ඉදින්; ආයස්මන්තානං, ආයුස්මතුන්ට; පත්තකල්ලං, පැමිණි කාල්ඇත්තේනම්;මයං,අපි; අඤ්ඤමඤ්ඤං, අන්‍යොන්‍යයාට; පාරිසුද්ධි උපොසථං, පිරිසිදුපොහොය; කරෙය්‍යාම,කරන්නෙමු; යනුමෙහිඅර්ථයි.

§ අජ්ජ, අද; මෙ, මාගේ; පවාරණා, පවුරුණුතොමෝ; පණ්ණරසී, පණ්ණරසීය නොහොත්; චාතුද්දසී, තුදුස්වක්ය; අධිට්ඨාමි, (එය) ඉටමි; යනුමෙහි අර්ථයි.

120 වීසුපනථෙරෙන,අහංආවුසොආයස්මන්තංපවාරෙමිදිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවාවදතුමං ආයස්මාඅනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං

121 නවකෙනාපිතථෙවවත්තබ්බංභන්තෙතිවචනමෙව විසෙසො,

122 තිසුවාචතුසුවාපන, සුණන්තුමෙආයස්මන්තොඅජ්ජපවාරණා පණ්ණරසී චාතුද්දසීතිවා යදායස්මන්තානං පත්තකල්ලංමයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාමාති ඤත්තිං ඨපෙත්වා ථෙරෙණ අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා පරිසංකායවා වදනතුමං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්සන්තා පටිකරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං,.

---

120 වීසුපන, දෙදෙනා අතුරෙහි වනාහි; ථෙරෙණ, මහල්ලහු විසින්; අහං ආවුසො ආයස්මන්තං පවාරෙමිදිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවාවදතුමංආයස්මාඅනුකම්පං උපාදායපස්සන්තො පටිකරිස්සාමීඉති, අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදතුමං ආයස්මා අනුකම්පංඋපාදාය පස්සන්තොපටි කරිස්සාමි,යී තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, පැවරියයුතු.*

121 නවකෙනාපි, නවකයා විසිනුදු; තථෙව, එසේම; වත්තබ්බං, කියයුතුය; භන්තෙඉති, භන්තෙයන, වචනමෙව; වචනයම; විසෙසො, වෙනසි.†

122 තිසුවාචතුසුවාපන, තුන්දෙනා අතුරෙහිහෝ; සතරදෙනා අතුරෙහිහෝ; වනාහි; සුණන්තු මෙ ආයස්මන්තො අජ්ජපවාරණා පණ්ණරසීඉතිවා, සුණන්තුමෙආයස්මන්තො අජ්ජපවාරණා පණ්ණරසී, සීකියාහෝ, චාතුද්දසීඉතිවා, සුණන්තුමෙආයස්මන්තොඅජ්ජපවාරණාචාතුද්දසී,සීකියාහෝ;යදායස්මන්තානංපත්ත

---

* ආවුසො, ඇවැත; අහං, මම; ආයස්මන්තං, ආයුෂ්මත්හට; පවාරෙමි, පවරමි; ආයස්මා, ආයුස්මත්තෙම; අනුකම්පං උපාදාය, කරුණාව පිණිස; දිට්ඨෙනවා, දුටුදෙයකින්හෝ; සුතෙනවා, ඇසූදෙයකින්හෝ; පරිසඞ්කායවා, සැකකළදෙයකින්හෝ; මං, මට; වදන්තු, කියාවා; පස්සන්තො, දක්නෙම්; පටිකරිස්සාමි, පැමිණි ඇවැත්පහළකරන්නෙමි; යනුමෙහි අර්ථයි-

† භන්තෙතිවචනමෙවවිසෙසො, යයිකියනලදබැවින්; අහංභන්තෙ ආයස්මන්තං පවාරෙමි, දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදතුමං ආයස්මාඅනුකම්පං උපාදාය පස්සන්තොපටිකරිස්සාමීයි තුන්යලක්; බිණියයුතුවේ-

123 නවකෙහිපි, තථෙවපටිපාටියා පවාරෙතබ්බං
භන්තෙ ති වචනා මෙව විසෙසො.

124 චතූහිඅධිකෙසුපන,සුණාතුමෙආවුසොසඞ්ඝොඅජ්ජපවාරණා පණ්ණරසී චාතුද්දසීතිවා යදිසංඝස්ස පත්තකල්ලං සංඝො පවාරෙය්‍යාතිඤත්තිං ඨපෙත්වා, වුඩ්ඪතරෙණසංඝං ආවුසො පවාරෙමිදිට්ඨෙනවා සුතෙනවා පරිසංකායවා වදතුමං සංඝො අනුකම්පංඋපාදායපස්සන්තො පටිකරිස්සාමිතිතික්ඛත්තුංවත්වා පවාරෙතබ්බං,.

කල්ලං මයංඅඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම, ඉති, යදායස්මන්තානංපත්තකල්ලං මයං, අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාම,යී ඤත්තිංඨපෙත්වා, ඤත්තියතබා; ථෙරෙණ, වැඩිමල්ලහුව්සින්; අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි, දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදන්තුමං ආයස්මන්තො අනුකම්පංඋපාදාය පස්සන්තො පටිකරිස්සාමිඉති, අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදන්තුමං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි,යී, තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, පැවරියයුතු-*.

123 නවකෙහිපි, නවකයන් විසිනුදු; තථෙව, එපරිද්දෙන්ම; පටිපාටියා, පිළිවෙළින්; පවාරෙතබ්බං, පැවරියයුතු; භන්තෙඉති, භන්තෙ, යනවචනමෙව, වචනයම්; විසෙසො, වෙනසි-†.

124 චතූහි, සතරදෙනෙකුගෙන්; අධිකෙසුපන, අධිකයන්අතුරෙහිවනානි: සුණාතුමෙආවුසො සංඝොඅජ්ජපවාරණා පණ්ණරසීඉතිවා, සුණාතුමෙ ආවුසො සංඝොඅජ්ජපවාරණා පණ්ණරසී, යයිකියාහෝ;චාතුද්දසීඉතිවා, සුණාතුමෙආවුසොසංඝො අජ්ජපවාරණා චාතුද්දසීයයි කියාහෝ; යදිසංඝස්ස පත්තකල්ලං සංඝොපවාරෙය්‍යාති, යදිසංඝස්සපත්තකල්ලං සංඝොපවාරෙය්‍යායී,ඤත්තිං ඨපෙත්වා, ඤත්තියතබා; වුඩ්ඪතරෙන, වැඩිමහල්ලා විසින්; සංඝං

* ආයස්මන්තො, ආයුෂ්මත්හු; මෙ, මාකියන්නක්; සුණන්තු අසත්වා; අජ්ජ, අද; පවාරණා, පවුරුණුතොමෝ; පණ්ණරසී, පණ්ණරසීය; නොහොත්, චාතුද්දසී, තුදුස්වක්ය; යදි, ඉදින්; ආයස්මන්තානං, ආයුස්මතුන්ට; පත්තකල්ලං, පැමිණිකල්ඇත්තේනම්; මයං, අපි; අඤ්ඤමඤ්ඤං, අනොන්‍යයාට, පවාරෙය්‍යාම, පවරම්හ; සෙසය යටකියනලද නයින් දතයුතු.

† භන්තෙනිවචනමෙව විසෙසො, යයිකියනලදබැවින් යටකියනලද 122 වාක්‍යයෙහි; ආවුසො, යනපදයට භන්තෙයයි යොද කියයුතුවේ.

125 නවකෙහිපි තථෙව පටිපාටියා සංඝම්හි භන්තෙ පවාරෙමි දිඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදතුමං සංඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටි කරිස්සාමීති තික්ඛත්තුං වත්වා පවාරෙතබ්බං,.

වත්තාදිකණ්ඩො-මූලසික්ඛා නිඨිතා.

---

ආවුසො පවාරෙමි දිඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදතුමං සංඝො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමිඉති, සංඝං ආවුසොපවාරෙමි දිඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදතුමං සංඝොඅනුකම්පං උපාදායපස්සන්තො පටිකරිස්සාමියි, තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, පැවරියයුතු-*.

125 නවකෙහිපි, නවකයන්විසිනුදු; තථෙව, එසේම; පටිපාටියා; පිළිවෙළින්; සංඝම්හි භන්තෙ පවාරෙමි දිඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදතුමං සංඝො අනුකම්පංඋපාදාය පස්සන්තො පටිකරිස්සාමිඉති, සංඝං භන්තෙ පවාරෙමි දිඨෙනවා සුතෙනවා පරිසඞ්කායවා වදතුමං සංඝො අනුකම්පංඋපාදාය පස්සන්තො පටිකරිස්සාමියි; තික්ඛත්තුං, තුන්යලක්; වත්වා, කියා; පවාරෙතබ්බං, පැවරිය යුතුයි-†.

වත්තාදිකණ්ඩො, වත් ආදිකාණ්ඩයයි-
මූලසික්ඛා, මූලශික්ෂාතොමෝ, නිඨිතා, නිමකරණලදු.

---

* ආවුසො, ඇවැත; සංඝො, සංඝතෙම; මෙ, මාහියන්නක්; සුණාතු, අසාවා; අජ්ජ, අද; පවාරණා, පවුරුණු; පණ්ණරසී, පණ්ණරසී වන්නීය නොහොත්; චාතුද්දසී, තුදුස්වක්වන්නීය; යදි, ඉදින්; සංඝස්ස, සංඝයාහට; පත්තකල්ලං, පැමිණිකල් ඇත්තේ නම්; සංඝො, සංඝතෙම; පවාරෙය්‍ය, පවරන්නේය; සෙස්ස යමකී නයයි; සංඝං, යනුපමණක් වෙනසි; සංඝයාට යනු එහිඅර්ථයි.
† භන්තෙ, වහන්ස; සංඝං, සංඝයාට; පවාරෙමි, පවරමියනුඅර්ථයි-
සෙස්ස යමකීනයයි.

ඉන්දදීපවිරෙන සංඝපතිනා සික්ඛාපිතොවිඤ්ඤුනා
සද්දත්ථෙව පසත්ථසත්ථුවචනෙ ආරඤ්ඤවාසිස්සතු
පඤ්ඤාතඤ්භිධානථෙරගරුනො සිස්සොසුබොධාවහං
ඤාණිනන්දසහ නාමධෙය්‍යථවිරො ව්‍යාඛ්‍යානිමංඛ්‍යාතවා

1 ඉනෙන්දුදයාදිවරදං සුමහන්තාවුත්තිං
නොපාසිතං ඉතරසත්ත විතානකෙහි
උලෙලොලජාල මවිලඞ්ඝිය සාලවෙලං
වන්දෙ පසන්නරතනං මුනිරාජ සින්ධුං,

2 මුත්තාගුණං සුපර්භොග මනොමකාන්තං
බන්ධුරනන්ත මලලාප පපුණ්ණමග්ගං
කල්‍යාණසන්ත කලම්බගල වත්ථුභූතං
සද්ධම්මදිබ්බ සරිතං විරතංභජාමි,

3 බඬංගුණෙන සකලෙලසු මධුංදදන්තං
නොලිම්පිතං සතතපාප කදම්බකෙහි
හංසෙහි සෙවිතමනග්ඝ සුසීලගන්ධං
සංසාරවිත්තු ගගණං සිරසාභිවන්දෙ,


4 ජම්බුනිකාය මභියාතක බන්තිකන්තා
කන්තාදරා සුතධර යතිසංඝමුඛා,
ඉන්දසභාදි චරියා විබුධාභිනන්ද
නන්දන්තා පරමසන්ති පදංලභන්තු,

5 සියාමායමූල පදමාදිගතාසිමාය
වක්ඛාත මණිනි පූරණ තරංගිගුල්ලං
භාවෙත්ථ මෙවනභිමාධු නිකායතංතු
සාධෙතිලොතු ජනතාය යතොතුතුසිං,

6 ගාල්වාභිධාන නගරස්ස සමීපභූතෙ
අත්මිවනාවිහ පටිතෙ පවරෙතුගාමෙ
ආරාධිතො යතිවරෙන තතොසුනාන්ද
රාමුදිතිස්ස විදිතෙන හිසාදරෙන,

7 ටීකානයං අනුවිලොකිය සබ්බගන්ථා
පො[illegible]ණකෙහි සුවිනිච්ඡිත මත්ථසාරං
ච[illegible]මං අභිනවං සුගන්ධිංකරිසං
ග[illegible]ලු ශුන්ත මිධසජ්ජනතා සලක්ඛං.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු